

වාර්ෂික වාර්තාව

2023

NMRA
NATIONAL MEDICINES REGULATORY AUTHORITY

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10.

පටුන

පිටු අංක.

සභාපතිතුමාගේ පණිවිඩය 6

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය 7

2023.01.01 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය 8

2023.12.31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය 9

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය 10

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය 11

1.1 හැඳින්වීම 11

1.2 අධිකාරියේ දැක්ම, මෙහෙවර, අරමුණු 13

1.2.1 අධිකාරියේ දැක්ම 13

1.2.2 අධිකාරියේ මෙහෙවර 13

1.2.3 අධිකාරියේ අරමුණු 13

1.3 ප්‍රධාන කාර්යයන් 14

1.4 ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ප්‍රධාන අංශ 14

1.4.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) 15

1.4.1.1 හැඳින්වීම 15

1.4.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ආංශික ව්‍යුහය 16

1.4.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ප්‍රධාන කාර්යයන් 16

1.4.2 ඖෂධ නියාමන අංශය 17

1.4.2.1 හැඳින්වීම 17

1.4.2.2 ඖෂධ නියාමන අංශයේ ආංශික ව්‍යුහය 18

1.4.2.3 ඖෂධ නියාමන අංශයේ ප්‍රධාන කාර්යයන් 18

1.4.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය 19

1.4.3.1 හැඳින්වීම 19

1.4.3.2 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යුහය 19

1.4.3.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යයන් 20

පිටු අංක.

1.4.4 මුල්‍ය අංශය 20

1.4.4.1 හැඳින්වීම 20

1.4.4.2 මුල්‍ය අංශයේ ආංශික ව්‍යුහය 21

1.4.4.3 මුල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් 21

1.4.5 මානව සම්පත් සහ පරිපාලන අංශය 21

1.4.5.1 හැඳින්වීම 21

1.4.5.2 මානව සම්පත් හා පරිපාලන අංශයේ ආංශික ව්‍යුහය 22

1.4.5.3 මානව සම්පත් සහ පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන් 22

1.4.6 නීති අංශය 23

1.4.6.1 හැඳින්වීම 23

1.4.6.2 නීති අංශයේ ආංශික ව්‍යුහය 24

1.4.6.3 නීති අංශයේ ප්‍රධාන කාර්යයන් 24

1.4.7 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය 25

1.4.7.1 හැඳින්වීම 25

1.4.7.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ආංශික ව්‍යුහය 25

1.4.7.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන් 25

2 පරිච්ඡේදය - අදාළ අංශවල ප්‍රගතිය 27

2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි (NMQAL) ප්‍රගතිය 27

2.2 ඖෂධ නියාමන අංශයේ ප්‍රගතිය 32

2.2.1 ඖෂධ නියාමන අංශය 32

2.2.2 වෛද්‍ය උපකරණ නියාමන අංශය 35

2.2.3 සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශය 45

2.2.4 විලවුන් නියාමන අංශය 49

2.2.5 නිෂ්පාදන නියාමන අංශය 50

2.2.6 මිල නියාමන ඒකකය 52

2.2.7 ඖෂධ සුරක්ෂිතතාවය පිලිබඳ අධීක්ෂණ අංශය 54

2.2.8 සායනික පරීක්ෂණ නියාමන අංශය 57

පිටු අංක.

	2.2.9 ඔසුසල් නියාමන අංශය	58
2.3	අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ප්‍රගතිය (IED)	58
2.4	මූල්‍ය අංශයේ ප්‍රගතිය	60
2.5	මානව සම්පත් හා පරිපාලන අංශයේ ප්‍රගතිය	61
2.6	නීති අංශයේ ප්‍රගතිය	65
2.7	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ප්‍රගතිය	66

පරිච්ඡේදය - 3 - සමස්ත මූල්‍ය කාර්ය සාධනය 67

පරිච්ඡේදය - 4 - තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය (SDG) 103

පරිච්ඡේදය - 5- අනුකූලතා වාර්තාව 105

කෙටි යෙදුම් ලැයිස්තුව

BPEC	සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටුව
CDD Act	විලවුන් උපකරණ සහ ඖෂධ පනත
CEC	විලවුන් ඇගයීම් කමිටුව
CFDI	ප්‍රධාන ආහාර හා ඖෂධ පරීක්ෂක
DO	සංවර්ධන නිලධාරි
FDI	ආහාර සහ ඖෂධ පරීක්ෂක
GDP	යහපත් බෙදාහැරීමේ පරිචයන්
GLP	යහපත් රසායනාගාර පරිචයන්
GMP	යහපත් නිෂ්පාදන පරිචයන්
GPP	යහපත් ඔසුසල් පරිචයන්
ICT	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ID Card	හැඳුනුම්පත
IED	අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
ISO	ප්‍රමිතිකරණය සඳහා ජාත්‍යන්තර සංවිධානය
IT	තොරතුරු තාක්ෂණය
KKS	කාර්යාල කාර්ය සහයක
MA	කළමනාකරණ සහකාර
MDEC	වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව
MEC	ඖෂධ ඇගයීම් කමිටුව
NDDCB	ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
NDQAL	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය
NMQAL	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය
NMRA	ජාතික ඖෂධ නියාමන අධිකාරිය
SCCT	සායනික පර්යේෂණ අනු කමිටුව
SDG	තිරසාර සංවර්ධන අරමුණු
SSFFC	බාලකළ/ කූට/ ව්‍යාජ ලෙස ලේබල් කළ/ ව්‍යාජ / නොමඟ යවන සුළු
TRIPS	බුද්ධිමය දේපල හිමිකම් පිළිබඳ වෙළඳාමට අදාළ අංශ
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
WD	ආපසු ගැනීම
WH	රඳවා ගැනීම
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය

සභාපතිතුමාගේ පණිවිඩය

පාර්ලිමේන්තු පනතක් මගින් 2015 දී පිහිටුවන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA), ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ස්වාධීන ආයතනයකි. ශ්‍රී ලංකාවේ සියලුම ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන නියාමනය කිරීමේ කාර්යය එය වෙත පැවරී ඇති අතර මෙම නිෂ්පාදන ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ ප්‍රත්‍යක්ෂභාවය අදාළ ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීමේ වගකීම දරයි.

2023 වර්ෂය ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ව්‍යාකූල වසරක් වූ අතර එම කාලය තුළ එයට අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය. ශක්තිමත් පාර්ලිමේන්තු පනත සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි කාර්ය මණ්ඩලයේ අනුවර්තනය වීමේ හැකියාව ශ්‍රී ලංකාවේ ඖෂධ නියාමන පද්ධතියේ සම්පූර්ණ බිඳ වැටීම වැළැක්වීය. නිවැරැදි දේශපාලන තීන්දු තීරණ, දේශපාලන මැදිහත්වීම් නොමැතිකම, කාර්ය මණ්ඩලයේ කැපවීම, විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් ලැබෙන සහයෝගය නිසා ජාතික ඖෂධ නියාමන අධිකාරිය මේ වන විට යථා තත්ත්වයට පත්වෙමින් සිටී. ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ක්‍රියාකාරිත්වය සුමටව සිදුවනු ඇතැයි අපේක්ෂාවෙන් වර්තමානයේදී ඊට අදාළ කටයුතු සකස් වෙමින් පවතී.

වර්ෂ 8කට වැඩි කාලයක් ජාතික ඖෂධ නියාමන අධිකාරිය මූල්‍යමය වශයෙන් ස්වාධීන වී ඇත. තවද, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සැලකිය යුතු භාණ්ඩාගාර බද්දක් සහ ආදායම් බදු ගෙවීමෙන් රජයට සහාය දක්වයි.

උසස් තත්ත්වයේ ඖෂධ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා දැරිය හැකි මිලකට ලබා ගත හැකි වන පරිදි සියලුම ඖෂධ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන නියාමනය කරනු ලබන නියාමකය ලෙස සිය වගකීම ඉටු කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය කැපවී සිටී.



විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම

සභාපති

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ස්වාධීන ආයතනයක් වන ශ්‍රී ලංකාවේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) මෙරටට ආනයනය කරන මෙන්ම නිෂ්පාදනය කරන සියලුම ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන් නියාමනය කරන එකම රාජ්‍ය ආයතනයයි.

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරි ලෙස, 2023 වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මම සතුටු වෙමි.

2023 වසර තුළදී, පශ්චාත් කොවිඩ් තත්ත්වය සහ රටේ ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සිය පිරිවැටුමේ සැලකිය යුතු වර්ධනයක් අත්කර ගෙන ඇත.

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ආදායම පදනම් වන්නේ නිෂ්පාදනය, ආනයනය ආදිය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ඖෂධ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ලියාපදිංචිය ලබා දීම සඳහා අය කරන ගාස්තු මතය. ඉහළ පිරිවැටුමක් ලබා ගැනීම තුළින් පැහැදිලිවම පෙන්නුම් කරන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස ප්‍රගතියක් ලබා ඇති බවයි. ඉහළ පිරිවැටුමක් ලබා ගැනීම තුළින්, භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු ගෙවීමෙන් රටේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමත් විය.

අපගේ ස්වාධීනත්වය පවත්වා ගැනීමට උපකාර වන අපගේ කාර්යක්ෂමතාව, මූල්‍ය තත්ත්වය සහ අනෙකුත් සියලුම මෙහෙයුම් කටයුතුවලදී වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගනිමින් අපගේ ශ්‍රම බලකාය සහ අපගේ මෙහෙයුම් රාමුව ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියක අපි නිරතව සිටිමු. තවද, අපගේ ශ්‍රම බලකායේ චිත්ත ධෛර්යය වර්ධනය කිරීමට සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ නිමැවුමක් ලබා ගැනීමට තුඩු දෙන සේවක ප්‍රතිලාභ වැඩි කිරීමට අපි සැලසුම් කරමින් සිටිමු.



වෛද්‍ය සචීන් සේමගේ

ප්‍රධාන විධායක නිලධාරි

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

2023.01.01 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය

1. මහාචාර්ය එස්.ඩී. ජයරත්න - සභාපති
2. විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර - ප්‍රධාන විධායක නිලධාරී
3. වෛද්‍ය අසේල ගුණවර්ධන
4. මහාචාර්ය ප්‍රදීප් ද සිල්වා
5. චතුර පරාක්‍රම මොහොට්ටිගෙදර මහතා
6. වෛද්‍ය කෝසල කරුණාරත්න
7. වෛද්‍ය ප්‍රියන්ත සේරසිංහ මහතා
8. මනෝජ් ගමගේ මහතා
9. සුපුල් විජේසිංහ මහතා
10. වෛද්‍ය ප්‍රදීප් කුමාරසිංහ

2023.12.31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය

1. විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම - සභාපති
2. දීපිකා බුලත්සිංහල මිය - ප්‍රධාන විධායක නිලධාරී (වැඩ බලන)
3. වෛද්‍ය අසේල ගුණවර්ධන - DGHS
4. මහාචාර්ය ප්‍රියදර්ශනී ගලප්පත්ති
5. වෛද්‍ය ප්‍රදීප් කුමාරසිංහ ද සිල්වා
6. වෛද්‍ය කෝසල කරුණාරත්න
7. වෛද්‍ය දුමින්ද ආරියරත්න
8. වෛද්‍ය බානුකි ජයසූරිය
9. වෛද්‍ය ප්‍රියන්ත සේරසිංහ
10. චතුර මොහොට්ටිගෙදර මහතා
11. සුපුල් විජේසිංහ මහතා
12. මනෝජ් ගමගේ මහතා

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

1. විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම - සභාපති
2. වෛද්‍ය සචීන් සේමගේ - ප්‍රධාන විධායක නිලධාරී
3. වෛද්‍ය අසේල ගුණවර්ධන - DGHS
4. මහාචාර්ය ප්‍රියදර්ශනී ගලප්පත්ති
5. වෛද්‍ය සනත් අක්මීමන
6. වෛද්‍ය ප්‍රදීප් කුමාරසිංහ ද සිල්වා
7. වෛද්‍ය කෝසල කරුණාරත්න
8. වෛද්‍ය දුමින්ද ආරියරත්න
9. වෛද්‍ය **ඛානුකි** ජයසූරිය
10. තමාරා අධිකාරි මිය
11. පාලිත මෙන්ඩිස් කුමාරසිංහ මහතා
12. සුසන්ත කහවත්ත මහතා
13. සුජීව මුදලිගේ මහතා

1 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යනු ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාසහිත නිෂ්පාදන නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති එකම රාජය ආයතනයයි. එමෙන්ම මහජනතාවට දැරිය හැකි මිලකට රට තුළ අලෙවි කෙරෙන සියලුම ඖෂධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සඵලත්වය සහ ප්‍රත්‍යක්ෂභාවය සහතික කිරීම සම්බන්ධයෙන් වගකියනු ලබන ආයතනයද වේ.

රට තුළ බෙදා හරින ලද ඖෂධ, වෛද්‍ය උපකරණ සහ විලවුන් නියාමනය කිරීමේ නීතිමය රාමුව 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත (CDD Act) සහ 1984 විලවුන්, උපකරණ සහ ඖෂධ රෙගුලාසි සහ 1980 සිට 2015 ජූලි දක්වා නිකුත් කරන ලද සංශෝධන මගින්ව සපයා ඇත. තවද, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සකස් කරන ලද අතර 2004 වර්ෂයේදී ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදි. ඉහත පනත් ප්‍රතිස්ථාපනය කරමින් 2015 වර්ෂයේදී මෙම කරුණු වෙනුවෙන් 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත (NMRA Act) පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබීය.

ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2015 ජූලි මස සිට ස්ථාපිත වූ අතර, එය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස 2015 ජූලි 01 වෙනි දින සිට රාජකාරීන් ආරම්භ කරන ලදි. ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ ස්වාධීන අධිකාරියක් ලෙස ශ්‍රී ලංකාවේ රෝගීන්ට ලබා දෙන ඖෂධ හා සම්බන්ධ නිෂ්පාදිතයන්හි සුරක්ෂිතභාවය, ගුණාත්මකභාවය, සඵලත්වය සහ සුලභත්වය පිලිබඳ සහතික කරමින් ස්වයං තීරණ ගැනීමේ සහ එම අධිකාරියෙහි කාර්යයන් පාලනය කිරීමට හැකියාවක් මෙම ආයතනය සතුය.

ඒ අනුව, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා පහත සඳහන් අංශ ස්ථාපිත කර සක්‍රිය කර ඇත.

- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)
- ඖෂධ නියාමන අංශය
- අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
- මූල්‍ය අංශය
- මානව සම්පත් සහ පරිපාලන අංශය
- නීති අංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

තවද, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහාය වීම සඳහා අදාළ ක්ෂේත්‍ර වල ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටු කිහිපයක් ද ඇත.

- ඖෂධ ඇගයීම් කමිටුව (MEC)
- වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව (MDEC)
- සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටුව (BPEC)
- සායනික පරීක්ෂණ අනු කමිටුව (SCCT)
- විලවුන් ඇගයීම් කමිටුව (CEC)
- ඔසුසල් ඇගයීම් කමිටුව
- ප්‍රචාරණ ඇගයීම් කමිටුව

මෙම කමිටු විසින් රට තුළ පවතින සියලුම නිෂ්පාදනවල ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ ප්‍රත්‍යක්ෂභාවය සහතික කිරීම සඳහා ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන, සායනික පරීක්ෂණ සහ විලවුන් ඇගයීමේ වගකීම දරනු ලබයි.

මීට අමතරව, එම සියලුම ඖෂධ ද්‍රව්‍ය මහජනතාවට දැරිය හැකි මිලකට ලබා ගැනීම සහතික කිරීම සඳහා වෙළඳපල මිල නියාමනය කිරීම සඳහා වන මිල නියාමනය කිරීමේ කමිටුව (Pricing Committee) වගකිව යුතු වේ.

මීට අමතරව, මහජනතාවට විවෘත වූ අභියාචනා කමිටුවක් සහ ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා උපදේශක කමිටුවක් ද ඇත.
තවද, නීතිමය අවශ්‍යතා ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මගින් යහපත් නිෂ්පාදන පරිවයන්(GMP), යහපත් බෙදාහැරීමේ පරිවයන් (GDP) සහ යහපත් ඔසුසල් පරිවයන් (GPP) පරීක්ෂා කරනු ලබයි.

1.2 අධිකාරියේ දැක්ම , මෙහෙවර සහ අරමුණු

1.2.1 අධිකාරියේ දැක්ම

"ගුණාත්මක බව සහතික කළ ඖෂධ, සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදන සහ විලවුන් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම."

1.2.2 අධිකාරියේ මෙහෙවර

"ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදනවල ආරක්ෂාව, ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා නියාමන අධීක්ෂණ සහ සාධක පදනම් තීරණ රෝගීන්ගේ යහපත සඳහා ලබා දීම."

1.2.3 අධිකාරියේ අරමුණු

1. ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු ඖෂධ, ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු වෛද්‍ය උපකරණ සහ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම.
2. ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය හෝ බලපත්‍ර අවලංගු කිරීම, නිෂ්පාදනය කිරීම, මිල නියම කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය කිරීම සහ බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම.
3. ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම සහ ආනයනය කිරීමට අදාළ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව, තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදුකරන බවට තහවුරු කිරීම.
4. අත්‍යාවශ්‍ය ඖෂධ සාධාරණ මිලකට පැවතීම සහතික කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ නිවැරදි තත්වයෙන් යුතු ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම.

5. සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් හා පාරිභෝගිකයන් විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ආරක්ෂාකාරී ලෙස සහ විචාරශීලී ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීම.
6. ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවලට සම්බන්ධිත අදාළ නීති සඳහා උචිත සංශෝධන නිර්දේශ කිරීම.
7. ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පිලිබඳ මහජනතාව, සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් සහ ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන සියලු දෙනා දැනුවත් කිරීම.
8. ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ අලෙවිකරණය නියාමනය කිරීම.
9. ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පැවතීම නියාමනය කිරීම.
10. ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය, ආරක්ෂාකාරී බව සහ අහිතකර ප්‍රතික්‍රියාවන් පිළිබඳව පශ්චාත් අලෙවිකරණ සමීක්ෂණ පැවැත්වීම.
11. ශ්‍රී ලංකාවේ සායනික පරීක්ෂණ පැවැත්වීමට අදාළ සියලු කටයුතු නියාමනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. නව ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම.
2. වෙළඳපොලේ දැනටමත් ලියාපදිංචි නිෂ්පාදනවල සංශෝධනය කිරීම් නියාමනය කිරීම
3. යහපත් නිෂ්පාදන පරිවයන් අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම
4. වෙළඳපොලේ ඇති ඖෂධ නිෂ්පාදිත සහ වෙළඳ දැන්වීම් සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී වීම
5. සායනික පරීක්ෂණ නියාමනය සහ අධීක්ෂණය කිරීම.
6. ඖෂධ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා යහපත් නිෂ්පාදන සහතික කිරීම
7. යහපත් ඔසුසල් පරිවයන් බලාත්මක කිරීම
8. වෙළඳපොලේ ඇති ඖෂධීය නිෂ්පාදන පරීක්ෂා කිරීම සහ නීතිය බලාත්මක කිරීම

1.4 ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ පවතින අංශ

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මනා ක්‍රියාකාරිත්වය පිණිස එහි පහත පරිදි අංශ ස්ථාපිත කර ඇත.

1. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)
2. ඖෂධ නියාමන අංශය
3. අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
4. මූල්‍ය අංශය

5. මානව සම්පත් සහ පරිපාලන අංශය
6. නීති අංශය
7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය (ICT)

1.4.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)


1.4.1.1 හැඳින්වීම

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ තත්ත්ව සහතික පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය සපයනු ලැබේ. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය දැනට 1990 දී NORAD අරමුදල් සහ උපදේශන සමඟ ඉදිකරන ලද තට්ටු 4 කින් සමන්විත ගොඩනැගිල්ලේ පවතින පහසුකම්වල යුක්ත වේ. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය හි ප්‍රධාන අංශ වන්නේ රසායනික, ක්ෂුද්‍රජීව, ජීව විද්‍යාත්මක, විමර්ශන ප්‍රමිතිය සහ ක්‍රමාංකනය සහ උපකරණ ය. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි මූලික කාර්යය වන්නේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය අවශ්‍යතා සමඟ අනුකූල වීම තීරණය කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ පැවැත්වීමයි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය විසින් ප්‍රමිතිය ආරක්ෂිතව සහ ප්‍රත්‍යක්ෂභාවය තක්සේරු කිරීමේදී සම්මත ඖෂධවේදය සහ අනෙකුත් පිළිගත් (වලංගු කළ) පරීක්ෂණ ක්‍රියා පටිපාටි අනුගමනය කරයි.

වර්තමානයේ ඖෂධ සහ වෛද්‍ය උපකරණ සීමිත ප්‍රමාණයක් විශ්ලේෂණ සිදු කරනු ලැබේ.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO/IEC 17025 හි අවශ්‍යතා සපුරාලීම සඳහා ස්ථාපිත කර ඇත. දැනට සිදුවෙමින් පවතින කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ක්‍රියාවලිය සහ රසායනාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය ප්‍රතීතන ක්‍රියාවලිය නතර වී ඇත.

1.4.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි (NMQAL) ආංශික ව්‍යූහය



*Note: due to lack of qualified staff following amendments were made to approved organization Structure.

1. Biological tests are not carried out at present.
2. Staff of former Biological, ref. Std & calibration, devices and cytosis Division are merged temporarily under the mane of 'Biological Division'. Accordingly, Chemical tests, Physical tests, Particulate Matter tests are conducted by this division.

1.4.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය හි ප්‍රධාන කාර්යයන්

1. දේශීයව නිෂ්පාදනය කරන ලද සහ ආනයනය කරන ලද ඖෂධ සහ වෛද්‍ය උපකරණ බෙදාහැරීමේ දාමයේ විවිධ ස්ථානවල දී විශ්ලේෂණය කිරීම. (පූර්ව අලෙවිකරණය සහ පශ්චාත් අලෙවිකරණ අදියරයන්) විශ්ලේෂණය සඳහා රජයේ සහ පෞද්ගලික ආයතනවලින් එකතු කරන ලද ලියාපදිංචි නියැදි, පැමිණිලි නියැදි, ටෙන්ඩර් නියැදි සහ නිරීක්ෂණ නියැදි ලෙස ඉදිරිපත් කරනු ලැබේ.
2. අවශ්‍ය අවස්ථාවන්හිදී අතිරේක අනුමත විශ්ලේෂකයෙකු ලෙස ක්‍රියා කිරීම.
3. GMP පරීක්ෂණ සඳහා සහභාගී වීම.
4. ලියාපදිංචි කිරීමේදී වලංගු කරන ලද අභ්‍යන්තර විශ්ලේෂණ ක්‍රියා පටිපාටි ඇගයීම.
5. බාහිර තත්ත්ව සහතික ඇගයීම් යෝජනා ක්‍රමයට සහභාගී වීම (ප්‍රවීණතා පරීක්ෂාව)
6. BPharm, BSc (Pharmacy) සහ Chemical Pathologist (PGIM) සඳහා තත්ත්ව සහතික පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
7. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් තීරණය කර ඇති පරිදි ඔවුන්ගේ සේවාවන් අවශ්‍ය යැයි සලකන විට දේශීය හෝ විදේශීය රසායනාගාර සමඟ සම්බන්ධීකරණය කිරීම.

1.4.2 ඖෂධ නියාමන අංශය

1.4.2.1 හැඳින්වීම


මෙම නියාමන අංශය, ඖෂධ නියාමන අංශය, වෛද්‍ය උපකරණ නියාමන අංශය, විලවුන් නියාමන අංශය, සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශය, නිෂ්පාදන නියාමන අංශය, ඔසුසල් නියාමන අංශය, ඖෂධ සුපරීක්ෂාකාරී අංශය, මිල නියාමන ඒකකය, සායනික පරීක්ෂණ නියාමන අංශය, HS කේත නිශ්කාෂණ අංශය, තොරතුරු, අධ්‍යාපනික සහ සන්නිවේදන අංශය වෙළඳපල පාලන සහ වෙළඳ ප්‍රචාරණ ඒකකය සහ තත්ත්ව කළමනාකරණ පද්ධති (QMS) ඒකකය යන උප අංශ වලින් සමන්විත වේ.

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි වගකීම් ඉටු කිරීම සඳහා බහුවිධ රැකියා භූමිකාවන් සහිත ඖෂධ ඇගයීම් නිලධාරින්, සහකාර ඖෂධ ඇගයීම් නිලධාරින් සහ ඖෂධවේදීන් විසින් උපරිම කාර්යක්ෂමතාවයෙන් දෛනික රාජකාරි සම්පූර්ණ කරනු ලැබේ.

අනාගතය සඳහා සැලසුම්

1. අධික පිරිසැකසුම් කිරීම අඩු කිරීම සහ අදාළ අංශවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සපුරාලිය යුතු ඉලෙක්ට්‍රොනික පද්ධති අවශ්‍යතාවය.
2. විනිවිදභාවය සහ ආරක්ෂාව සහතික කිරීම ක්‍රියාවට නැංවීම සඳහා ඩිජිටල්කරණය කළ පද්ධති.
3. අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම
4. පශ්චාත් වෙළඳපල නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම
5. සම්මත පරිණත මට්ටම සාක්ෂාත් කර ගැනීම

1.4.2.2 ඖෂධ නියාමන අංශයේ ආංශික ව්‍යූහය



1.4.2.3 ඖෂධ නියාමන අංශයේ ප්‍රධාන කාර්යයන්

ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ ඖෂධ, වෛද්‍ය උපකරණ, විලවුන් ද්‍රව්‍ය සහ සීමාස්ථ නිෂ්පාදන මහජනතාවට දැරිය හැකි මිලකට ලබා දීම සඳහා ඒවායේ ආරක්ෂාව සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම සහ සහතික කිරීම ඇතුලත්ව;

1. ඖෂධ, වෛද්‍ය උපකරණ, විලවුන් සහ සීමාස්ථ නිෂ්පාදන සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි කිරීම සහ නිර්දේශ ලබා දීම සඳහා ඇගැයීම සහ කටයුතු සිදු කිරීම.
2. දේශීය නිෂ්පාදකයින් සහ විදේශීය නිෂ්පාදකයින්ගේ ඖෂධ නිෂ්පාදන පහසුකම් සහ ක්‍රියාවලීන් නියාමනය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම
3. මිල නියාමනය
4. දිවයින පුරා ඔසුසල් නියාමනය කිරීම
5. ඖෂධ සුපරීක්ෂාකාරී කටයුතු
6. ASYCUDA පද්ධතිය හරහා ඖෂධීය නිෂ්පාදනයන්හි HS කේත නිෂ්කාශනය කිරීම
7. සායනික අත්හදා බැලීම්වලට අදාළ සියලු අංශ නියාමනය සහ පාලනය කිරීම

1.4.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය


1.4.3.1 හැඳින්වීම

අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය යනු 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ස්ථාපිත අංශයකි.

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ අධිකාරිය විසින් බලය පවරනු ලබන සහ විධානය කරනු ලබන පරිදි ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ විධිවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටළු අධීක්ෂණය කිරීම සහ විමර්ශනය කිරීමයි. ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ බලයලත් නිලධාරීන් ලෙස මෙම කටයුතු සිදු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ආහාර සහ ඖෂධ පරීක්ෂක නිලධාරීන් දෙදෙනෙකු මෙම ඒකකයට පත් කර ඇත. දැනට මෙම ඒකකය ප්‍රධාන ආහාර සහ ඖෂධ පරීක්ෂක (C-FDI) විසින් මෙහෙයවනු ලැබේ.

අන් අය සමඟ නිරන්තර සම්බන්ධතා අවශ්‍ය රාජකාරි ඉටු කිරීමේදී බොහෝ දුරට ක්ෂේත්‍රයේ රාජකාරි කරන ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස ආහාර සහ ඖෂධ පරීක්ෂක සලකනු ලැබේ.

1.4.3.2 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යූහය



1.4.3.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය හි ප්‍රධාන කාර්යයන්


1. ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ බලයලත් නිළධාරීන් ලෙස කටයුතු කිරීම
2. පශ්චාත් අලෙවි සමීක්ෂණ පැවැත්වීම
3. අවශ්‍ය වූ විටකදී විධිමත් සහ අවිධිමත් ලෙස නියැදි ලබාගැනීම
4. බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන පරීක්ෂා කිරීම සහ එම ආයතන නිර්දේශ කිරීම
5. බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ ප්‍රවාහනය කරන වාහන පරීක්ෂා කිරීම සහ එම වාහන නිර්දේශ කිරීම
6. නිෂ්පාදන ආපසු කැඳවීමේ ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම
7. SSFFC සහ හොර බඩු ජාවාරම්වලින්ව රඳවාගනු ලැබූ ඖෂධ නිෂ්පාදන සම්බන්ධයෙන් විමර්ෂශන පැවැත්වීම සහ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම
8. පෞද්ගලික වෙළඳපොලෙන් රජයට අයත් ඖෂධ ලබාගැනීමේ හැකියාව විමර්ශනය කිරීම
9. අන්තරායකර ඖෂධ යෙදවුම් පරීක්ෂා කිරීම සහ නිර්දේශ කිරීම
10. අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම
11. පනත යටතේ සිදුකරනු ලැබූ උල්ලංඝණය කිරීම්වලට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට කටයුතු කිරීම
12. නීතිය බලාත්මක කිරීමේ අනිකුත් නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කිරීම

1.4.4 මූල්‍ය අංශය

1.4.4.1 හැඳින්වීම

අධිකාරිය තුළ ඇති සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් පාලනය කිරීම මූල්‍ය අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව ලැබුණු සියලුම ආදායම් මූලාශ්‍ර හඳුනාගෙන මුදල් ප්‍රවාහය ඵලදායී ලෙස හසුරුවනු ලැබේ. වාර්ෂික අයවැය පුරෝකථනය සකස් කිරීමේදී මුදල් අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ සියලුම වියදම් ඇතුළුව නියමිත වේලාවට අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමයි. මීට අමතරව, ජාතික ඖෂධ නියාමන අධිකාරියෙ හි අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් සුමට ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලුම ප්‍රසම්පාදන කටයුතු මූල්‍ය අංශය විසින් මෙහෙයවනු ලැබේ.

1.4.4.2 මූල්‍ය අංශයේ ආංශික ව්‍යුහය



1.4.4.3 මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ප්‍රධාන ආදායම් මාර්ග දහඅටක් හරහා ආදායම් ලැබීම.
2. අවසන් ගිණුම් පිළියෙල කිරීම
3. ඉදිරි වර්ෂය සඳහා අයවැය සකස් කිරීම සහ ඒ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම
4. අධිකාරියේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සියලුම සැපයුම් පවත්වාගෙන යාම
5. සියලුම මුදල් පාලන ක්‍රියාකාරකම්
6. ප්‍රසම්පාදන කටයුතු

1.4.5 මානව සම්පත් හා පරිපාලන අංශය


1.4.5.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරිය ආරම්භයේ සිටම මානව සම්පත් හා පරිපාලන අංශය අධිකාරිය වෙනුවෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මානව සම්පත් හා පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ මානව සම්පත් සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම්වල නියැලීම සහ ඖෂධ නියාමන අංශයේ අනුමැතිය මත සියලු වර්ගවල ඖෂධීය නිෂ්පාදන වල සහ විලවුන් සැපයුම්කරුවන්ට ආනයන / නියැදි බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමයි.

මීට අමතරව, ගොඩනැගිලි නඩත්තු කිරීම, විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම, වාහන කළමනාකරණය/ සේවා සැපයීම සහ අළුත්වැඩියා කිරීම, සියලු ආකාරයේ බිල්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීම, නිවාඩු සහ අනෙකුත් කාර්ය මණ්ඩල විධිවිධාන පවත්වාගෙන යාම, කාර්ය මණ්ඩල සුබසාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම මානව සම්පත් සහ පරිපාලන

අංශය විසින් සිදු කරනු ලබයි. අනෙකුත් ආයතන සමඟ ද විධිමත් සන්නිවේදනයක් ඇති කර ගනිමින් තම ගනුදෙනුකරුවන්ට උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීමටද උපකාර කරයි.

1.4.5.2 මානව සම්පත් සහ පරිපාලන අංශයේ ආංශික ව්‍යූහය



1.4.5.3 මානව සම්පත් සහ පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙ හි සියලුම මානව සම්පත් කාර්යයන්, පරිපාලන සහ නඩත්තු කටයුතු ආවරණය කිරීම සඳහා මෙම අංශය ස්ථාපිත කර ඇති අතර අධිකාරියේ අරමුණු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා සේවකයින් උපරිමව උපයෝජනය සහ ඖෂධ, වෛද්‍ය උපකරණ, විලවුන් සහ සීමාස්ථ නිෂ්පාදන සඳහා බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා විශේෂයෙන් ස්ථාපිත කර ඇත.

ඒ අනුව මානව සම්පත් හා පරිපාලන අංශයේ ක්‍රියාත්මක වන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

1. අධිකාරියේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, සංවර්ධනය කිරීම, රඳවා තබා ගැනීම සහ ඉවත් කිරීමේ ක්‍රියාවලීන් හැසිරවීම.
2. ලිපිගොනු ඇගයීමෙන් පසු බලපත්‍ර නිකුත් කිරීම - ඖෂධ (නිෂ්පාදන සහ ආනයන බලපත්‍රය), වෛද්‍ය උපකරණ (නිෂ්පාදන සහ ආනයන බලපත්‍රය), නියැදි බලපත්‍ර සහ ලියාපදිංචි බලපත්‍ර නිකුත් කිරීම (ඖෂධ සහ වෛද්‍ය උපකරණ) ලියාපදිංචි සහතික සහ බලපත්‍ර මුද්‍රණය කිරීම, සහ ඇගයීම් පත්‍ර විද්‍යුත් තැපෑලෙන් යැවීම.
3. බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම

4. අධිකාරිය තුළ සේවක කළමනාකරණය
5. කාර්යාල පරිශ්‍රයේ නඩත්තුවට අදාළ සියලු කටයුතු අධීක්ෂණය කිරීම
6. උපයෝගිතා සේවා පවත්වාගෙන යාම
7. අංශයට අදාළව වාර්තා සකස් කිරීම
8. වාහන සහ ප්‍රවාහන කළමනාකරණය
9. කාර්ය මණ්ඩල නිවාඩු සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම (නිල /දේශීය / විදේශීය)
10. ස්ථිර කාර්ය මණ්ඩලයේ සහ පුහුණු කාර්ය මණ්ඩලයේ පැමිණීම සහතික කිරීම
11. ආරක්ෂාව, පිරිසිදු කිරීම, විදුලිය, විදුලි සෝපාන සේවා, වායු සමීකරණ, ඡායා පිටපත් යනාදිය වැනි අදාළ සේවාවන් අධිකාරියට අවශ්‍ය බාහිර පාර්ශ්වවලින් ලබා ගෙන, සියලුම බිල්පත් ගෙවීම් සකස් කිරීම.
12. බාහිර හා අභ්‍යන්තර ලේඛනාගාර අධීක්ෂණය
13. කාර්ය මණ්ඩල හැඳුනුම්පත් නිකුත් කිරීම

1.4.6 නීති අංශය


1.4.6.1 හැඳින්වීම

2017 අප්‍රේල් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපිත කරන ලද නීති අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පාර්ශවකරුවෙකු වන සියලුම නඩු කටයුතු ඇතුළුව සියළුම නීතිමය සහ නියාමන ගැටළු සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් ලබා දෙමින් අධිකාරිය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි නියාමන කාර්යයන් සඳහා නීති අංශයේ කාර්යභාරය අවශ්‍ය වේ.

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් සෘජුව සම්බන්ධ වී සිදු කරනු ලබන අනෙකුත් නියාමන කටයුතු වලදී නීති ප්‍රකාරව නීතිමය අදහස් දැක්වීමේ වගකීම නීති අංශය සතු වේ.

1.4.6.2 නීති අංශයේ ආංශික ව්‍යූහය



1.4.6.3 නීති අංශයේ ප්‍රධාන කාර්යයන්

ගිවිසුම්, ගැසට් පත්‍ර, අමාත්‍ය මණ්ඩල සංදේශය, අවබෝධතා ගිවිසුම් සහ වෙනත් නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම, ප්‍රාථමික සහ ද්විතීයික නීති සංශෝධනය කිරීම, උපදෙස් දීම සහ සමාලෝචනය කිරීම සඳහා නීති අංශය වගකිව යුතුය. උදා: නීති, රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සැකසීම ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි නීති අංශයේ වගකීම් සහ කාර්යයන් වේ. නීති අංශය විසින් නියෝජිතායතන පැවරුම් කටයුතු සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය සම්බන්ධ වෙනත් ඕනෑම කරුණක් සඳහා අයදුම්පත් සැකසීම, අධීක්ෂණය සහ උපදේශන කටයුතු සිදුකිරීම, ජාතික ඖෂධ නියාමන අධිකාරිය හි අනෙකුත් අංශ මෙන්ම බලපත්‍රලාභීන්, පාර්ශ්වකරුවන්, අමාත්‍යාංශ/ කොට්ඨාශ සහ වෙනත් සංසද මගින් යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් නීති අංශය නීතිමය අදහස් ලබා දෙන අතර පාර්ලිමේන්තු කටයුතුවලට අදාළව අවශ්‍ය පියවර ගනු ලැබේ.

2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ විවිධ නියාමන කරුණු සහ නීතිමය කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය වන අවස්ථා වලදී නීති අංශය විසින් අධිකාරියට උපදෙස් ලබා දෙයි. අභියාචනාධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, වානිජ මහාධිකරණය, මහාධිකරණය, කම්කරු විනිශ්චය සභාව සහ මානව හිමිකම් කොමිෂන් සභාව, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව යනාදිය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පාර්ශවයක් ලෙස සඳහන් කර ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී ඕනෑම කොමිෂන් සභාවක, විමර්ශන / CID විමර්ශන සඳහා


සහභාගි වීම. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ලැබෙන සියලුම අයදුම්පත් පිළිබඳ කටයුතු කිරීම සහ නීති අංශයට අදාළ වෙනත් ඕනෑම රාජකාරියක් නීති අංශය විසින් මෙහෙයවනු ලැබේ.

1.4.7 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය

1.4.7.1 හැඳින්වීම

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය වෙබ් අඩවිය, ප්‍රාදේශීය ජාලය, දත්ත සමුදායන් සහ පරිගණක දෘඪාංග සහ මෘදුකාංග ඇතුළුව තොරතුරු සහ සන්නිවේදනය කළමනාකරණය කිරීමේ වගකීම දරයි. මෙයට, නිතිපතා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, ජාල ගැටළු වලට විසඳුම් සෙවීම, සංරක්ෂිත පිටපත් ගැනීම, දෘඪාංග සහ මෘදුකාංග ගැටළු නිරාකරණය කිරීම සහ තාක්ෂණික සහාය සැපයීම ඇතුළත් වේ.

1.4.7.2 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) අංශයේ ආංශික ව්‍යුහය



1.4.7.3 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ජාතික ඖෂධ නියාමන අධිකාරි නිල වෙබ් අඩවිය කෙටුම්පත් කිරීම, යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම.
2. ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි දත්ත නඩත්තු කිරීම සඳහා සහාය ලබා දීම. මෙයට සංරක්ෂිත පිටපත් ගැනීම, ආකෘති සෑදීම, ගූගල් පැතුරුම්පත් නඩත්තු කිරීම සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය තුළ භාවිතා වන අනෙකුත් දත්ත සමුදායන් පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික සහාය ලබා දීම ඇතුළත් වේ.
3. ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි පරිගණක සහ ජාල නඩත්තු කිරීම.

4. අන්තර්ජාල සහ ජාල ගැටළු දෝෂ නිරාකරණය කිරීම සහ අසාර්ථක වීම් සහ අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් සේවා සපයන්නන් සම්බන්ධ කර ගැනීම.
5. ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි හි කාර්ය මණ්ඩලයට ඊමේල් සහ අන්තර්ජාල සේවා සැපයීම
6. මෘදුකාංග ස්ථාපනය කිරීම සහ දෘඪාංග සහ මෘදුකාංග ගැටළු නිරාකරණය කිරීම.
7. මාර්ගගත රැස්වීම් සංවිධානය කිරීම, රැස්වීම් අතරතුර තාක්ෂණික සහාය ලබා දීම, ඉල්ලීම් අනුවමාර්ගගත රැස්වීම් පටිගත කිරීම.
8. CCTV කැමරා පද්ධතිය නිරීක්ෂණය කිරීම සහ CCTV කැමරා පද්ධතියේ ගැටළු සහ නඩත්තුව සම්බන්ධයෙන් සේවා සපයන්නා සම්බන්ධ කර ගැනීම.

2 වන පරිච්ඡේදය

අදාළ අංශවල ප්‍රගතිය

අර්ධ ස්වාධීන පාලනයක් සහිත නිශ්චිත ඖෂධ නියාමන අධිකාරියක් ඇති කිරීමට රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස, ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2015 ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත සමඟ පිහිටුවන ලදී. එහි වගකීම වන්නේ ආරක්ෂාව, ප්‍රත්‍යක්ෂභාවය, ගුණාත්මකභාවය සහ මිල යන මාධ්‍යයන් මගින් සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ඖෂධ නිෂ්පාදන (ඖෂධ, වෛද්‍ය උපකරණ , සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන්) නියාමනය කිරීමයි.

අධිකාරිය පිහිටුවීමේ මුල් වසරවල සිටම, එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බොහෝ අඩුපාඩු විය. එසේ සියළු දෑ තිබියදීත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය රටට විශිෂ්ට සේවාවක් ලබා දීමට සමත් වී ඇත.

2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ප්‍රගතිය

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ වර්තමාන කාර්ය මණ්ඩලය

	තනතුර	කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව
1	වැඩ බලන අධ්‍යක්ෂ (අංශ ප්‍රධානි/ ක්ෂුද්‍ර අංශය)	01
2	වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (අංශ ප්‍රධානි/ ක්ෂුද්‍ර අංශය)	01
3	ඖෂධ විශ්ලේෂක	04
4	ඖෂධවේදී	05
5	සංවර්ධන නිලධාරී	01
6	කළමනාකරණ සහකාර	03
7	රසායනාගාර සහායක	00
8	කා.කා.ස	08

නියැදි තත්ත්වය

නියැදි වර්ගය	*** අතැති නියැදි ගණන 2023.01.01**	**වර්ෂය තුළ ලැබුණු නියැදි ගණන**	**වර්ෂය තුළ නිකුත් කරන ලද වාර්තා ගණන**	**අතැති නියැදි ශේෂය 31.12.2023**
ලියාපදිංචි කිරීම	21	57	46	32
ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ නිරීක්ෂණ	51	31	70	12
වෛද්‍ය සැපයුම් අංශයේ නිරීක්ෂණ	7	23	20	10
රසායනාගාර ඉල්ලීම්	2	2	2	2
පැමිණිලි	16	281	152	145
ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන්	44	107	59	92
උසාවි නියැදි	36	86	79	43
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් / පෙර නැවිගත කිරීම	0	7	4	3
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව	0	1	1	0
අනෙකුත්	0	21	14	7
මුළු එකතුව	**177**	**616**	**447**	**346**

* 2013 ජනවාරි 1 සිට 2023 මාර්තු 31 දක්වා

ඉල්ලීම් කාණ්ඩ අනුව පරීක්ෂා කරන ලද නියැදි

වර්ගය	දේශීය නිෂ්පාදන		ආනයනික නිෂ්පාදන		එකතුව	
1) පෙර අලෙවිකරණය	සමත්	අසමත්	සමත්	අසමත්	සමත්	අසමත්
ලියාපදිංචි කිරීම	16	3	21	6	37	9
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	0	0	1	3	1	3
වෙනත් ඉල්ලීම් (නිශ්චිත)	0	0	0	0	0	0
2) පශ්චාත් අලෙවිකරණය						
A) පශ්චාත් අලෙවිකරණය						
ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරයේ නිරීක්ෂණ	46	8	11	6	57	14
පැමිණිලි	13	28	49	44	62	72
වෛද්‍ය සැපයුම් අංශය	8	5	0	7	8	12
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	0	0	0	0	0	0
B) ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන්						
අවිධිමත්	10	1	9	2	19	3
විධිමත්	1	2	26	1	27	3
C) වෙනත් නිශ්චිත ඉල්ලීම් **(** රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ වෙනත්)	2	3	3	7	5	10
මුළු එකතුව	**96**	**50**	**120**	**76**	**216**	**126**

නිකුත් කරන ලද මුළු වාර්තා ගණන

නිෂ්පාදන කාණ්ඩය	**සමත්**	**අසමත්**	**එකතුව**	**කාණ්ඩයේ අසාර්ථකත්වය %**
ආනයනය කරන ලද	120	76	196	**39**
දේශීය	96	50	146	**34**
උසාවි නියැදි			79	
වෙනත් නිෂ්පාදන. අත් සේදුම්කාරක, ආලේපන (නිශ්චිත)			26	
නිකුත් කළ සම්පූර්ණ වාර්තා	216	126	**447**	**28**

වෙළෙඳපොළ තත්ත්වය අනුව අසාර්ථක වීම්

නිෂ්පාදන කාණ්ඩය	**සමත්**	**අසමත්**	**එකතුව**	**කාණ්ඩයේ අසාර්ථකත්වය %**
පෙර වෙළෙඳපොළ	38	12	50	24
පශ්චාත් වෙළෙඳපොළ	178	114	292	39

අභ්‍යන්තර විශ්ලේෂණ පරීක්ෂණ ක්‍රම ඇගයීම් සංඛ්‍යාව	**තත්ත්ව අසාර්ථකත්වය පිළිබඳ නිෂ්පාදනකරුවන්ගේ පැහැදිලි කිරීම් වලට ලද පිළිතුරු සංඛ්‍යාව**
17	6

GMP පරීක්ෂණ

	වැඩ භූමියේ නම සහ ලිපිනය
1	ඒස් හෙලත් කෙයා ප්‍රයිවට් ලිමිටඩ් - හොරණ
2	ඒසීඅයි ෆාමසියුටිකල්ස් ලිමිටඩ් - බංග්ලාදේශය
3	අප්පසාමි ඔකියුලර් ඩිවයිසස් ප්‍රයිවට් ලිමිටඩ්
4	සීපීසීඅයි ෆාමසියුටිකල්ස් - වියට්නාමය
5	ඩ්‍රීම් ලයිෆ් සයන්ස් ප්‍රයිවට් ලිමිටඩ් - බණ්ඩාරගම
6	ඉමර්ජන් ලයිෆ් සයන්සස්
7	ෆාබ් ෆර්මා ප්‍රයිවට් ලිමිටඩ් - ඉන්දියාව
8	ෆෙල්ක්සි කෙයා ප්‍රයිවට් ලිමිටඩ් - බණ්ඩාරවෙල
9	අයිසීඑල් බ්‍රෑන්ඩස් - ඒකල
10	අයිසසොලෙස් බයෝටෙක් ෆාමා
11	කෙලුන් ලයිෆ් සයන්ස් ප්‍රයිවට් ලිමිටඩ් - මහනුවර
12	ක්වලිටි ෆාමසියුටිකල්ස් - ඉන්දියාව
13	ලාෆ් ලයිෆ් සයන්සස් - කොග්ගල

14	ලිනා ස්පිරෝ ප්‍රයිවට් ලිමිටඩ් - ශ්‍රී ලංකාව
15	ලුපයින් ලිමිටඩ් - ඉන්දියාව
16	එම්සීඅයි මැනුෆැක්චර්ස් - ශ්‍රී ලංකාව
17	මෙඩිකොම් ප්‍රයිවට් ලිමිටඩ් - දෙහිවල
18	සීමාසහිත නවෙස්ටා ෆාමසියුටිකල්ස් ලිමිටඩ් - ශ්‍රී ලංකාව
19	නිව්ජෙන් ලංකා හෙල්ත්කෙයා - කුරුණෑගල
20	පැනසියා මෙඩිකල්
21	ෆිනික්ස් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්
22	පිටි මර්ක් - ඉන්දුනීසියාව
23	සැන්ඩස් ඇක්ටිව්- ජා - ඇල
24	සවිත්‍ර මෙඩිකෙයා සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් - බණ්ඩාරගම
25	එස්පීඑම්සී- රත්මලාන
26	සර්ගි ෆාමා- කැලණිය
27	ස්විස් පේරන්ටරල්ස් - ඉන්දියාව
28	විම්ෆාකෝ, වියට්නාමය
29	යාදෙන් ප්‍රයිවට් ලිමිටඩ් - කටුනායක

2.2 ඖෂධ නියාමන අංශයේ ප්‍රගතිය

2.2.1 ඖෂධ නියාමන අංශය

ඖෂධ ලිපිගොනු ඇගයීම

අයදුම්පත් වර්ගය	ලැබුණු අයදුම්පත් ගණන	ඇගයීමට ලක් කළ අයදුම්පත් ගණන
නව ඖෂධ අයදුම්පත්	990	502
MEDREG අයදුම්පත්	26	142
නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත්	466	624
අතිරේක අයදුම්පත් (Additional)	662	453
විවලනය (Variation)	567	173

ලිපිගොනු ඇගයීම සඳහා ඖෂධ ඇගයීමේ කමිටු (MEC) - අනුකමිටු රැස්වීම් ගණන = 21

New Molecular Entity (NME) සඳහා වන අයදුම්පත් සමාලෝචනය

2023 දී ඉදිරිපත් කළ NCE මුළු ගණන	**පිළිගත් NCE සංඛ්‍යාව**	**ප්‍රතික්ෂේපිත NCE සංඛ්‍යාව**	**MEC පොරොත්තුවෙහි පවතින**
71	52	19	-

පුද්ගලික භාවිතය සඳහා අවසරය ලබාදීම සඳහා අයදුම්පත් ඇගයීම

පුද්ගලික පරිශීලක අවසර ලිපි සඳහා ලැබුණු මුළු අයදුම්පත්	**සමාලෝචනය කරන ලද සහ අනුමත කරන ලද අයදුම්පත් සංඛ්‍යාව**	**සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව**
236	233	3

ඖෂධ නියැදි ආනයන බලපත්‍රය සඳහා අයදුම්පත් ඇගයීම

ඖෂධ නියැදි බලපත්‍ර -2023	
ලද අයදුම්පත් ගණන	1516
ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් ගණන	246
ඖෂධ ඇගයීමේ කමිටු (MEC) විසින් අනුමත කරන ලද අයදුම්පත් ගණන	919
අසම්පූර්ණ ලියකියවිලි හේතුවෙන් අපේක්ෂිත අයදුම්පත් සංඛ්‍යාව (දැනටමත් දේශීය නියෝජිතයා වෙත දන්වා ඇති නමුත් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු)	128
නිකුත් කර ඇති නියැදි බලපත්‍ර ගණන	1135

පවත්වන ලද ඖෂධ ඇගයීමේ කමිටු (MEC) රැස්වීම් ගණන =12

ඖෂධ ඇගයීමේ කමිටු (MEC) අනුකමිටු ගණන = 21

පාලිත ද්‍රව්‍ය සඳහා අයදුම්පත්

ලැබුණු අයදුම්පත් ගණන	**ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව**	**ලැබුණු අයදුම්පත්** අතුරින් නිකුත් කරන ලද මුළු **අයදුම්පත් සංඛ්‍යාව**
ආනයනට ලබා දුන් අවසර ගණන	-	119
මාසික කෝටා අනුමැතිය සඳහා වන ලිපි ගණන	-	33
බලයලත් පුද්ගලයින් වෙත වූ ලිපි ගණන	-	39

ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය (Waiver of Registration) නිකුත් කිරීම

අයදුම්පත්‍ර වර්ගය	**2023** දී පිළිගත් අයදුම්පත්‍ර ගණන	අනුමත කළ අයදුම්පත්‍ර සංඛ්‍යාව	අනුමත නොකළ / තීරණය පොරොත්තු
ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය WOR (විශේෂ මාර්ගය)	216	75	141
ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය WOR (සාමාන්‍ය මාර්ගය)	99	72	27
පරිත්‍යාග	50	194	06

ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අයදුම්පත් සමාලෝචනය සඳහා පැවැත්වූ රැස්වීම් ගණන = 11

නැවගත කිරීමේ නිෂ්කාශන (Shipment Clearance) අනුමැතිය සඳහා අයදුම්පත් සමාලෝචනය

ලැබුණු අයදුම්පත් ගණන	සමාලෝචනය කරන ලද සහ අනුමත කරන ලද අයදුම්පත් සංඛ්‍යාව	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
4436	3503	190

ඖෂධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම


පරිපාලන අංශයෙන් ලැබුණු ලියාපදිංචි සහතිකපත් ගණන	දත්ත පද්ධතියට ඇතුළත් කළ සහතික ගණන ඇතුළු කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව	ඇතුළු කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව
1771	කාලය දීර්ඝ කරන ලද ලියාපදිංචි සහතික - 21	0
	නව සහතික- 1750	

2.2.2 වෛද්‍ය උපකරණ නියාමන අංශය

වෛද්‍ය උපකරණ අයදුම්පත්වල (Dossiers) මාසික ඇගයීම (ලිපිගොනු)


මාසිකව ඇගයීමට ලක් කරන ලද නව ලිපිගොනු

මාසය සහ වර්ෂය	නව	
	භාරගැනීමේ ස්ථානය වෙත ලැබී ඇති අයදුම්පත් ගණන	ඇගයීම සම්පූර්ණ කරන ලද ලිපිගොනු
ජනවාරි - 23	53	60
පෙබරවාරි - 23	35	64
මාර්තු - 23	56	55
අප්‍රේල් - 23	43	85
මැයි - 23	66	34
ජූනි - 23	101	53
ජූලි - 23	50	37
අගෝස්තු - 23	67	43
සැප් - 23	57	57
ඔක් - 23	54	41
නොවැම්බර් - 23	61	48
දෙසැම්බර් - 23	40	56
මුළු එකතුව	**683**	**633**




මාසිකව ඇගයීමට ලක් කළ නැවත ලියාපදිංචි කිරීමේ ලිපිගොනු (RR)

මාසය සහ වර්ෂය	නැවත ලියාපදිංචි කිරීම්	
	භාරගැනීමේ ස්ථානය වෙත ලැබී ඇති අයදුම්පත් ගණන	ඇගයීම සම්පූර්ණ කරන ලද ලිපිගොනු
ජනවාරි - 23	13	22
පෙබරවාරි - 23	16	45
මාර්තු - 23	3	12
අප්‍රේල් - 23	10	19
මැයි - 23	9	20
ජූනි - 23	7	16
ජූලි - 23	6	18
අගෝස්තු - 23	5	11
සැප් - 23	6	13
ඔක් - 23	11	10
නොවැම්බර් - 23	7	25
දෙසැම්බර් - 23	10	12
මුළු එකතුව	**103**	**223**




මාසික ඇගයීම් අලුත් කිරීමේ ලේඛන

මාසය සහ වර්ෂය	අලුත් කිරීම්	
	භාරගැනීමේ ස්ථානය දක්වා ලැබී ඇති අයදුම්පත් ගණන	ඇගයීම සම්පූර්ණ කරන ලද ඩොසියර
ජනවාරි -23	37	86
පෙබරවාරි -23	22	88
මාර්තු -23	65	77
අප්‍රේල් -23	7	114
මැයි - 23	35	80
ජූනි - 23	77	58
ජූලි -23	63	25
අගෝස්තු - 23	46	68
සැප් - 23	65	52
ඔක් - 23	29	42
නොවැම්බර් - 23	46	33
දෙසැම්බර් - 23	67	40
මුළු එකතුව	**559**	**763**




මාසික විචලන (Variation) ලිපිගොනු ඇගයීම්

මාසය සහ වර්ෂය	විචලන (Variation)	
	භාරගන්නා ස්ථානයට අයදුම්පත් ලැබී ඇති	සම්පූර්ණ කරන ලද ඩොසියර ඇගයීම
ජනවාරි - 23	10	6
පෙබරවාරි - 23	11	14
මාර්තු - 23	13	20
අප්‍රේල් - 23	8	12
මැයි - 23	5	4
ජූනි - 23	12	11
ජූලි - 23	7	2
අගෝස්තු - 23	9	7
සැප් - 23	23	9
ඔක් - 23	29	14
නොවැම්බර් - 23	11	9
දෙසැම්බර් - 23	27	10
මුළු එකතුව	**165**	**118**




විදේශීය නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීමේ ගොනු ඇගයීම

මාසය සහ වර්ෂය	නව		අතිරේක (Additional)	
	භාරගන්නා ස්ථානයට ලැබී ඇති අයදුම්පත්	ඇගයීම සම්පූර්ණ කරන ලද ගොනු	භාරගන්නා ස්ථානයට ලැබී ඇති අයදුම්පත්	ඇගයීම සම්පූර්ණ කරන ලද ගොනු
ජනවාරි - 23	15	25	2	0
පෙබරවාරි - 23	11	25	3	0
මාර්තු - 23	14	39	2	5
අප්‍රේල් - 23	5	6	2	1
මැයි - 23	16	20	4	1
ජූනි - 23	17	22	8	1
ජූලි - 23	16	15	4	3
අගෝස්තු - 23	21	16	1	6
සැප් - 23	23	13	0	2
ඔක් - 23	20	15	5	1
නොවැම්බර් - 23	23	20	1	3
දෙසැම්බර් - 23	22	11	1	0
මුළු එකතුව	**203**	**227**	**33**	**23**



නියැඳි ආනයන බලපත්‍ර ඇගයීම


මාසය සහ වර්ෂය	භාරගන්නා ස්ථානයට ලැබී ඇති අයදුම්පත්		ඇගයීම සම්පූර්ණ කරන ලද අයදුම්පත්	
ජනවාරි - 23	108	නව = 75	166	අනුමත = 123
		අතිරේක = 33		ප්‍රතික්ෂේප කිරීම් = 43
පෙබරවාරි - 23	93	නව = 64	159	අනුමත = 137
		අතිරේක = 29		ප්‍රතික්ෂේප කිරීම් = 22
මාර්තු - 23	102	නව = 86	113	අනුමත = 93
		අතිරේක = 16		ප්‍රතික්ෂේප කිරීම් = 20
අප්‍රේල් - 23	54	නව = 48	103	අනුමත = 89
		අතිරේක = 06		ප්‍රතික්ෂේප කිරීම් = 14
මැයි - 23	101	නව = 96	70	අනුමත = 63
		අතිරේක = 05		ප්‍රතික්ෂේප කිරීම් = 7
ජූනි - 23	123	නව = 118	74	අනුමත = 69
		අතිරේක = 05		ප්‍රතික්ෂේප කිරීම් = 5
ජූලි - 23	103	නව = 103	80	අනුමත = 63
				ප්‍රතික්ෂේප කිරීම් = 17
අගෝස්තු - 23	163	නව = 163	49	අනුමත = 46
				ප්‍රතික්ෂේප කිරීම් = 03
සැප් - 23	69	නව = 69	98	අනුමත = 84
				ප්‍රතික්ෂේප කිරීම් = 13
ඔක් - 23	93	නව = 93	136	අනුමත = 91
				ප්‍රතික්ෂේප කිරීම් = 45
නොවැම්බර් - 23	74	නව = 74	71	අනුමත = 63
				ප්‍රතික්ෂේප කිරීම් = 08
දෙසැම්බර් - 23	43	නව = 4	49	අනුමත = 40
				ප්‍රතික්ෂේප කිරීම් = 09
මුළු එකතුව	**1126**		**1168**	



ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීම


මාසය සහ වර්ෂය	**අයදුම්පත් ලැබී ඇති**	නිර්දේශිත අයදුම්පත්	නිර්දේශ නොකළ අයදුම්පත්
ජනවාරි - 23	87	71 (පරිත්‍යාග-65/ ICL-5 / වෙනත් -1)	05
පෙබරවාරි - 23	55	45 (පරිත්‍යාග-37/ ICL-7 / වෙනත් -1)	00
මාර්තු - 23	63	43 (පරිත්‍යාග-24/ ICL-3 / වෙනත් -16)	03
අප්‍රේල් - 23	23	18 (පරිත්‍යාග-15/ ICL-00 / වෙනත් -03)	00
මැයි - 23	44	34 (පරිත්‍යාග-24/ ICL-00 / වෙනත්-10)	00
ජූනි - 23	43	30 (පරිත්‍යාග-29/ ICL-00 / වෙනත් -01)	02
ජූලි - 23	30	25 (පරිත්‍යාග-22/ ICL-00 / වෙනත් -03)	02
අගෝස්තු - 23	59	26 (පරිත්‍යාග-26/ ICL-00 / වෙනත්- 03/ මීළඟ WOR කමිටුවට -33)	00
සැප් - 23	33	21 (පරිත්‍යාග-17/ ICL-00 / වෙනත් - 02/ප්‍රධාන විධායක නිලධාරී මිනිත්තු-2/ මීළඟ WOR කමිටුවට -12)	00

ඔක් - 23	37	29 (පරිත්‍යාග-27/ ICL-00 / වෙනත්-02/ප්‍රධාන විධායක නිලධාරී මිනිත්තුව-0/ මීළඟ WOR කමිටුවට -06)	02
නොවැම්බර් - 23	38	18 (පරිත්‍යාග-12/ ICL-00 / වෙනත්-06/ප්‍රධාන විධායක නිලධාරී මිනිත්තු-0/ අපේක්ෂිත තීරණය -04)	16
දෙසැම්බර් - 23	39	05 (පරිත්‍යාගය-02/ ICL-00 / වෙනත්-03/ප්‍රධාන විධායක නිලධාරී මිනිත්තුව - 0/ මීළඟ කමිටුව -34)	00
මුළු එකතුව	**551**	**365**	**30**




නැවගත කිරීම් (Shipment Clearance) නිෂ්කාශන නිකුත් කිරීම

මාසය සහ වර්ෂය	භාරගන්නා ස්ථානයට අයදුම්පත් ලැබී ඇති	නිර්දේශිත නැවගත කිරීම් නිෂ්කාශන
ජනවාරි - 23	69	69
පෙබරවාරි - 23	49	49
මාර්තු - 3	90	90
අප්‍රේල් - 23	42	42
මැයි - 23	50	50
ජූනි - 23	44	44
ජූලි - 23	27	27
අගෝස්තු - 23	40	40
සැප් - 23	21	21
ඔක් - 23	20	20
නොවැම්බර් - 23	18	18
දෙසැම්බර් - 23	13	13
මුළු එකතුව	**483**	**483**



නියෝජ්‍යත්ව හුවමාරු ක්‍රියාවලිය

මාසය සහ වර්ෂය	නීති අංශය වෙත ඉදිරිපත් කරන ලද ගොනු
ජනවාරි - 23	26
පෙබරවාරි - 23	10
මාර්තු - 23	13
අප්‍රේල් - 23	07
මැයි 23	21
ජූනි - 23	08
ජූලි - 23	09
අගෝස්තු - 23	00
සැප් - 23	21
ඔක් - 23	17
නොවැ - 23	03
දෙසැ - 23	11
මුළු එකතුව	**146**




2.2.3 සිමාස්ථ නිෂ්පාදන නියාමන අංශය

අයදුම්පත් ලියාපදිංචි කිරීම


නව අයදුම්පත්

මාසය	ලද මුළු එකතුව	මුළු ඇගයීම
ජනවාරි - 23	04	06
පෙබරවාරි - 23	02	06
මාර්තු - 23	02	04
අප්‍රේල් - 23	01	03
මැයි - 23	06	03
ජූනි - 23	03	07
ජූලි - 23	02	06
අගෝස්තු - 23	08	-
සැප් - 23	01	01
ඔක් - 23	03	01
නොවැම්බර් - 23	03	02
දෙසැම්බර් - 23	01	-
මුළු එකතුව	**36**	**39**




අතිරේක (Additional) අයදුම්පත්‍ර

මාසය	ලද මුළු එකතුව	මුළු අගයන ලද
ජනවාරි - 23	01	03
පෙබරවාරි - 23	02	12
මාර්තු - 23	05	02
අප්‍රේල් - 23	07	02
මැයි - 23	08	-
ජූනි - 23	02	01
ජූලි - 23	05	08
අගෝස්තු - 23	05	12
සැප් - 23	03	11
ඔක් - 23	03	03
නොවැම්බර් - 23	09	06
දෙසැම්බර් - 23	-	11
මුළු එකතුව	**51**	**71**




අයදුම්පත්‍ර වර්ගීකරණය

මාසය	**ලද මුළු එකතුව**	**මුළු අගයන ලද**
ජනවාරි	08	26
පෙබරවාරි	13	39
මාර්තු	10	22
අප්‍රේල්	28	22
මැයි	11	27
ජූනි	08	15
ජූලි	22	17
අගෝස්තු	09	09
සැප්තැම්බර්	08	16
ඔක්තෝම්බර්	10	18
නොවැම්බර්	14	49
දෙසැම්බර්	08	17
මුළු එකතුව	**149**	**255**



නියැදි බලපත්‍ර


මාසය	**ලැබුණු මුළු එකතුව**	**මුළු අගයන ලද**
ජනවාරි	07	07
පෙබරවාරි	10	10
මාර්තු	10	10
අප්‍රේල්	09	09
මැයි	03	03
ජූනි	-	-
ජූලි	02	02
අගෝස්තු	-	-
සැප්තැම්බර්	01	01
ඔක්තෝම්බර්	03	03
නොවැම්බර්	03	03
දෙසැම්බර්	07	07
මුළු එකතුව	**55**	**55**



ලැබුණු සහ ඇගයීමට ලක් වූ නියැදි බලපත්‍ර අතර සංසන්දනය තීරු ප්‍රස්ථාරය මගින්

2.2.4 විලවුන් නියාමන අංශය

මාසය (2023)	නව		අතිරේක (Additional)		RR		නියැඳි බලපත්‍ර	
	ලැබුණු	අගයන ලද	ලැබුණු	අගයන ලද	ලැබුණු	අගයන ලද	ලැබුණු	අගයන ලද
ජනවාරි	183	206	65	78	0	1	31	58
පෙබරවාරි	95	80	105	75	8	0	22	32
මාර්තු	152	129	201	86	22	14	104	0
අප්‍රේල්	64	51	226	54	8	0	12	79
මැයි	122	105	236	83	5	12	60	64
ජූනි	140	111	177	73	8	8	107	70
ජූලි	63	143	131	60	3	3	96	79
අගෝස්තු	192	100	200	88	6	2	83	84
සැප්තැම්බර්	271	102	68	134	4	5	83	152
ඔක්තෝම්බර්	220	131	105	178	3	8	89	31
නොවැම්බර්	267	147	124	147	3	1	81	53
දෙසැම්බර්	187	91	90	96	5	0	69	54
මුළු	**1956**	**1396**	**1728**	**1152**	**75**	**54**	**837**	**756**



2.2.5 නිෂ්පාදන නියාමන අංශය (MFRD)

GMP දේශීය නිෂ්පාදන ස්ථාන පරීක්ෂා කිරීම්		
වර්ගය	**ඉල්ලීම් ගණන**	**පරීක්ෂා කිරීම් ගණන**
ඖෂධ නිෂ්පාදකයින්	32	44
වෛද්‍ය උපකරණ නිෂ්පාදකයින්	21	19
විලවුන් නිෂ්පාදකයින්	38	41
නැවත ඇසුරුම් කිරීම	01	01
මුළු එකතුව	**92**	**105**

GMP විදේශීය නිෂ්පාදන ස්ථාන විගණනය (සියලු ඖෂධ නිෂ්පාදකයින්)			
ඉල්ලීම් ගණන	**අනුමත කර ඇති කණ්ඩායම්**	**පොරොත්තු අනුමැතිය**	**පරීක්ෂණ පවත්වන ලද ගණන**
13 (July of 2023)	13 (July of 2023)	00 (July of 2023)	15 (January-December 2023)

විදේශීය නිෂ්පාදන ස්ථාන අනුමත කිරීම සඳහා අයදුම්පත්		
අයදුම්පත් වර්ගය	**ලැබුණු**	**අගයන ලද**
නව	47	45

සකස් කිරීම් (formulation)අනුමත කිරීම සඳහා අයදුම්පත්				
ලැබුණු	ඖෂධ ඇගයීම් කමිටුව (MEC) විසින් අනුමත	ඖෂධ ඇගයීම් කමිටුව (MEC) විසින් ප්‍රතික්ෂේපිත	අගයන ලද	අවසන් නොවූ ගණන
879	648	22	553	85

	GMP සහතික	CPPs	නොම්ලේ විකුණුම් සහතික
ඉල්ලීම්	40	50	139
නිකුත් කළ	38	50	139
කටයුතු සිදුවන	02	00	00

නිෂ්පාදන සඳහා නිෂ්පාදන බලපත්‍ර

1. ලැබුණු අයදුම්පත් ගණන - 785
2. මුද්‍රණය කිරීම සඳහා නිර්දේශ කර ඉදිරියට යවන ලද - 784

දීර්ඝ කරන ලද GMP සහතික

1. ලැබුණු අයදුම්පත් ගණන - 15
2. දීර්ඝ කරන ලද GMP සහතික ගණන - 15

විවිධ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරිත්වය	ඉල්ලීම්	නිකුත් කරන ලද ලිපි	කටයුතු සිදුවන
පැහැදිලි කිරීමේ ලිපි නිකුත් කිරීම	653	634	12 - ගෙවීම් සිදු කර නොමැති
VAT / PAL නිදහස් කිරීම සඳහා නිර්දේශ	752	751	00
අපනයන අනුමත ලිපි නිකුත් කිරීම	08	07	01- ගෙවීම් සිදු කර නොමැති

පුහුණු

1. PIC/S හි සංවිධායක තායි FDA විසින් සංවිධානය කරන ලද 2023 නොවැම්බර් 08-10 දින තායිලන්තයේ බැංකොක් හි පැවැත්වෙන 2023 දී හොඳ GMP / GDP පරීක්ෂකයෙකු බවට පත් කරන මෘදු කුසලතා පිළිබඳ PIC/S සම්මන්ත්‍රණය
2. ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදකයින්ගේ සංගමය (SLPMA) 2023 ජූලි 18-19 0f යන දිනවල සංවිධානය කරන ලද GMP පුහුණුව
3. GMP පරීක්ෂණය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන 2023 මැයි මස 15 වැනි සඳුදා NDQAL ශ්‍රවණාගාරයේදී පෙ.ව. 9.30 සිට MFRD විසින් පැවැත්වීම.

2.2.6 මිල නියාමන ඒකකය

ළඟා කරගැනීම්


1. යාවත්කාලීන කරන ලද රෙගුලාසි ක්‍රියාත්මක කිරීම තුළින් අත්පත් කරගත් මිල නියාමන යාන්ත්‍රණයන්හි වැඩි දියුණු කළ විනිවිදභාවය සහ වගවීම.
2. කාර්යක්ෂම මිල ඇගයීම් සඳහා පහසුකම් සැලසීම.
3. ඵලදායී මිල නියාමනය සඳහා විවෘත සංවාද සහ සහයෝගීතාව පෝෂණය කිරීම, පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ සහයෝගීතාවය ශක්තිමත් කිරීම.


2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා පවත්වන ලද කමිටුවල විස්තර

කමිටුවේ නම	**2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පවත්වන ලද කමිටු ගණන**
මිල නියාමන අනුකමිටු	36
මිල නියාමන කමිටු	07
පාර්ශවකරුවන් සමඟ විශේෂ කමිටු	06

මිල නියාමන අංශය විසින් සමාලෝචනය කරන ලද අයදුම්පත් විස්තර

ලිපි ගොනු													
	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
අයදුම්පත් ලැබීම්	147	130	139	65	74	55	67	89	115	138	122	69	**1210**
සමාලෝචනය කිරීම්	178	218	217	181	85	37	66	177	151	181	124	38	**1653**
අනුමත කිරීම්	97	111	131	114	51	29	51	143	69	95	74	33	**998**
සිදුවන සාකච්ඡා කිරීම්													**212**
ආනයන බලපත්‍ර													
	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
අයදුම්පත් ලැබීම්	262	199	185	162	150	83	201	114	290	143	147	128	**2064**
සමාලෝචනය කිරීම්	204	171	184	168	152	78	41	138	212	157	211	37	**1753**
අනුමත කිරීම්	141	116	167	94	99	51	26	83	167	101	90	32	**1167**
සිදුවන සාකච්ඡා කිරීම්													**462**






2.2.7 ඖෂධ සුපරීක්ෂණ අංශය

තත්ත්ව අසමත්වීම් සහිත ඖෂධ කළමනාකරණය

අධ්‍යක්ෂ (ජා.ඖ.ත.ආ.ප), SAFRESC හෝ ආපසු කැඳවීම කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත පදනම්ව ඖෂධ සුපරීක්ෂාකාරී අංශය විසින් ඖෂධ කාණ්ඩයේ /කාණ්ඩ/ නිෂ්පාදන ආපසු ගැනීම සහ රඳවා ගැනීම් පිළිබඳ දැනුම්දීම් නිකුත් කරන ලදී. පහත වගුවේ දැක්වෙන්නේ 2023 දී රඳවා තබා ගැනීම සඳහා සිදු කරන ලද භාණ්ඩ තොග ප්‍රමාණය සහ ඉවත් කර ගැනීම් ය. එසේම නිෂ්පාදකයන්

විසින් ආරම්භ කරන ලද ස්වේච්ඡා ආපසු කැඳවීම් සහ දෝෂ සහිත ඇසුරුම් භාවිතය නතර කිරීම් නියමිත වේලාවට පාර්ශවකරුවන් වෙත දන්වා ඇත.


මාසය	රඳවා ගැනීම		ඉවත් කර ගැනීම		අඩුපාඩු පෙන්වන ඇසුරුම් අත්හිටුවීම	ස්වේච්ඡා ආපසු කැඳවීම		තීරණ අවලංගු කිරීම
	කාණ්ඩය	නිෂ්පාදන	කාණ්ඩය	නිෂ්පාදන		කාණ්ඩය	නිෂ්පාදන	
ජනවාරි	3	අදාළ නොවේ	4	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
පෙබරවාරි	1	අදාළ නොවේ	5	අදාළ නොවේ	1	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
මාර්තු	1	අදාළ නොවේ	4	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
අප්‍රේල්	1	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
මැයි	4	අදාළ නොවේ	1	අදාළ නොවේ	අදාළ නොවේ	2	2	අදාළ නොවේ
ජූනි	4	අදාළ නොවේ	1	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	1	අදාළ නොවේ
ජූලි	2	1	5	2	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
අගෝස්තු	1	අදාළ නොවේ	4	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
සැප්තැම්බර්	4	1	4	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
ඔක්තෝම්බර්	අදාළ නොවේ	1	10	1	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
නොවැම්බර්	1	අදාළ නොවේ	7	1	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
දෙසැම්බර්	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ



අහිතකර ප්‍රතික්‍රියා වාර්තාකරණ පද්ධතිය

1. ADR වාර්තාවලින් වැඩි ප්‍රමාණයක් ඖෂධ සුපරීක්ෂාකාරී අංශය වෙත අතින් ලැබී ඇත. 2023 දී, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වෙබ් අඩවියේ නිර්මාණය කරන ලද මාර්ගගත වාර්තාකරණ පද්ධතිය වැඩිදියුණු කරන ලද අතර, ADR වාර්තාව කාර්යක්ෂමව ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත පද්ධතිය භාවිතා කරන ලෙස රජයේ ඖෂධවේදීන්ට දැනුම් දෙන ලදී.
2. වට්ස්ඇප් සමූහය ආරක්ෂාව සහ අවදානම් ඇගයීම් අනුකමිටුව සඳහා නිර්මාණය කරන ලද අතර එමඟින් කමිටු සාමාජිකයන් අතර සන්නිවේදනය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු විය.
3. අහිතකර ප්‍රතික්‍රියා වාර්තා කළද, රාජ්‍ය අංශයේ ව්‍යාජ නිෂ්පාදන හඳුනාගෙන හඳුනාගත් ව්‍යාජ නිෂ්පාදන වහාම ඉවත් කර ගැනීමට පියවර ගන්නා ලදී.
4. ඖෂධ සුපරීක්ෂණ අංශයේ සේවය කරන නිලධාරීන්ට උප්සලා සුපරීක්ෂණ මධ්‍යස්ථානයේ VigiFlow වෙත ප්‍රවේශය නොතිබුණි. ඖෂධ සුපරීක්ෂණ අංශයේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා 2023 දී VigiFlow වෙත ප්‍රවේශ වීමට අවකාශ ලැබුණි.
5. WHO Global Surveillance and Monitoring System (GSMS) වෙත ප්‍රවේශය නිර්මාණය කර ආරම්භ කරන ලද්දේ ප්‍රමිතියෙන් තොර සහ ව්‍යාජ ඖෂධ පිළිබඳ විස්තර GSMS වෙත උඩුගත කිරීම සඳහා ය.
6. ඖෂධ සුපරීක්ෂණ අංශය වෙත ADR වාර්තා කිරීමේ ප්‍රගතිය

මාසය	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.
ලද ADR ගණන	0	4	0	22	35	13	14	48	66	59	30	38



මුළු සම්බන්ධීකරණ රැස්වීම් ගණන

1. නැවත කැඳවීම් කළමනාකරණ කමිටු රැස්වීම් = 7
2. ආරක්ෂාව සහ අවදානම් ඇගයීමේ අනුකමිටු = 9

2.2.8 සායනික පරීක්ෂණ අංශය

1. සායනික පරීක්ෂණ ඇගයීම් කමිටුව (CTEC) සඳහා පවත්වන ලද රැස්වීම් ගණන: 11
   ඉලක්කය : වසරකට අවම වශයෙන් රැස්වීම් 10 ක් (ඉලක්කය සපුරා ඇත)

2. සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලද සායනික අත්හදා බැලීම් අයදුම්පත් වල සාරාංශය

   2023.01.01 සිට 2023.12.31 දක්වා ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව : 06

   විමර්ශන නව ඖෂධ (INDs) පිළිබඳ අත්හදා බැලීමේ අයදුම්පත් ගණන : 03

   * 2023 වර්ෂය සඳහා සමාලෝචනය කරන ලද මුළු අයදුම්පත් සංඛ්‍යාව : 07

කාල සීමාව සඳහා බදු ව්‍යදම්	884,235,134	212,916,207
ආදායම් බදු සඳහා ගැලපීම්	90,833,350	
ස්ථාවර කැන්පතු 2022 සඳහා පොලී ආදායම් ගැලපීම්	15,203,418	
භාණ්ඩාගාර බැඳුම්කර මත පොලී ආදායම් ගැලපීම්	(2,634,892)	
භාණ්ඩාගාර බිල්පත් මත පොලිආදායම් ගැලපීම්	(10,437,346)	
බැඳුම්කර 2022 සඳහා පොලිආදායම් ගැලපීම්	2,607,842	
	990,790,376	212,916,207
ගෙවීම්	(10,982,871)	(201,933,336)
2023 සඳහා ස්වයං තක්සේරු ගෙවීම්	(106,458,104)	
ගෙවිය යුතු ආදායම් බදු	873,349,402	10,982,871

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එම්එස්යූ/බී/එන්එම්ආර්ඒ/1/23/32

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 ඔක්තෝම්බර්08 දින

National Medicines Regulatory Authority
09 OCT 2024
Chairman Office

සභාපති

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

Account Department
10 OCT 2024
National Medicines Regulatory Authority Colombo 10.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - 01. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

02. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එම්එස්යූ/බී/එන්එම්ආර්ඒ/1/23/32 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 ඔක්තෝම්බර් 08 දින

සභාපති
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42(a) සහ 42(b) ඡේද ප්‍රකාරව නිවැරදි කළ යුතු පිළිවෙළින් රු.13,961,263 ක සහ රු.828,980 ක ඉකුත් වර්ෂවල වැරදි සෘජුවම සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට ගැලපුම් කර තිබූ නමුත් පිළිවෙලින් සංසන්දනාත්මක අගයන් නැවත දැක්වීම (Restate) මඟින් සහ ආරම්භක ශේෂයන් නැවත දැක්වීම මඟින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 80(b) ඡේදය ප්‍රකාරව ඉකුත් කාලපරිච්ඡේදවල ආදායම් බදු සඳහා සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගන්නා ලද ඕනෑම ගැලපීමක්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදමට ඇතුළත් කළ යුතුය. එහෙත්, 2022 දෙසැම්බර් 15 දිනැති අංක PN/IT/2022-03 දරන බදු නිවේදනයේ 6 ඡේදය ප්‍රකාරව 2022 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බදු අනුපාතය සියයට 30 ලෙස සංශෝධනය කර තිබුණ ද, අධිකාරිය විසින් සමස්ථ වර්ෂය සඳහාම සියයට 14 ක පැවති බදු අනුපාතය අදාළ කර ගෙන තිබූ අතර ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ බදු වියදමෙහි සිදු වූ අවතක්සේරුවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ඵෙන බදු ගැලපීමක් සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 7(a) ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයකට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ හැකියාව පවතී නම්, එය වත්කමක් ලෙස හඳුනාගත යුතුය. එහෙත් අධිකාරිය විසින් වසර 08කට අධික කාලයක සිට භාවිතා කරන සෞඛ්‍ය අමාත්‍යාංශය සතු කොළඹ 10හි පිහිටි සිවිමහල් කාර්යාල ගොඩනැගිල්ල, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය ස්ථාපිත කර ඇති තෙමහල් ගොඩනැගිල්ල, එම ගොඩනැගිලි පිහිටි ඉඩම හා වාහන 06 ක් ද, ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් පවරා ගන්නා ලද තවත් වාහන 03 ක් ද, අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර එබැවින් ක්ෂය ගණනය කර ගිණුම්ගත කිරීමට ද නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ ප්‍රමාණාත්මක වටිනාකමකින් අවතක්සේරු වී තිබූ අතර වාර්ෂික ලාභය සහ සමුච්චිත අරමුදල් ශේෂය ද අධිතක්සේරු වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 61 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 8 ප්‍රකාරව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. එහෙත් අධිකාරිය විසින් එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශූන්‍ය වූ පිරිවැය රු.40,425,110 ක් වූ වත්කම් අයිතම 339 ක් තව දුරටත් භාවිතා කරමින් පැවතුණු අතර මෙම ප්‍රමිතියේ 76 ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳව හෙළිදරව් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමේ දී, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර පොළී ආදායම් ගැලපීමට අදාළව රු.10,464,396 ක් ආදායම් බදු වියදම්න් වැරදි සහගත ලෙස අඩුකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම සහ ගෙවිය යුතු ආදායම් බදු වගකීම මෙම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2023 දෙසැම්බර් 31 දින වන විට සෘජුවම බැංකුව වෙත ලැබී තිබුණු රු. 7,583,570 ක මුදල වර්ගීකරණය නොකළ තැන්පතු (Deposits to be classified) ලෙස ජංගම වගකීම් යටතේ හඳුනාගෙන තිබුණද වර්ගීකරණය නොකළ තැන්පතු තුළ ඇතුළත් වගකීම්වල ස්වභාවය විගණනයට පැහැදිලි නොවූයෙන් අදාළ ශේෂයේ නිවැරදිභාවය විගණනයේ දී තහවුරු නොවීය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්ථාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මා නිගමනය කරන්නේනම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන නොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයෙන් දක්වා ඇති නිරීක්ෂණයන්ට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලිකිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනත	
	(i) පනතේ 40 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශයෙහි 4.4 ඡේදය	අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීමට හා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.
	(ii) පනතේ 38(1)(ඉ) වගන්තිය	නිකුත් කරන ලද විගණන විමසුම් 05 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

(i) II වැනි පරිච්ඡේදයේ 8.1 ඡේදය	ඖෂධ ඇගයීම් නිලධාරී තනතුර සඳහා අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් 07 දෙනෙකු වෙනුවෙන් පත්වීම් ලිපි ලබා දී නොතිබුණි.
(ii) II වැනි පරිච්ඡේදයේ 10.1, 10.2 හා 10.3 ඡේද	පරිපාලන නිලධාරිනිය සහ ඖෂධ ඇගයීම් නිලධාරීන් 10 දෙනෙකු පොදු ආකෘතිපත්‍ර 169 ට අනුව වෛද්‍ය වාර්තා ලබාදී නොතිබුණි.
(iii) II වැනි පරිච්ඡේදයේ 10.7 ඡේදය	සෑම නිලධාරියෙකු ම තනතුරක් භාර ගන්නා විට 160 පොදු ආකෘති පත්‍රයෙහි ගිවිසුමකට අත්සන් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(iv) VI වැනි පරිච්ඡේදයේ 2.10 ඡේදය	සෑම පත්කිරීමක් සම්බන්ධයෙන්ම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් වාර්තා කළ යුතු කරුණු පිළිබඳ සම්පූර්ණ විස්තර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(v) VI වැනි පරිච්ඡේදයේ 5.2 හා 5.3 ඡේද	යම් චෝදනාවකට වරදකරු වුවහොත් මිස විනයානුකූල කරුණකට සම්බන්ධ ලිපි කිසිවක් පෞද්ගලික ලිපිගොනුවේ ගොනු නොකළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(vi) VIII පරිච්ඡේදයේ 4.1 ඡේදය	මාණ්ඩලික නිලධාරීන් සඳහා අතිකාල දීමනා නිමි නොවුණද, නිලධාරීන් 36 දෙනෙක් සඳහා අතිකාල දීමනා ලෙස රු.646,694 ක් ගෙවා තිබුණි.
(vii) XII පරිච්ඡේදයේ 23 ඡේදය	විදේශ නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව නිලධාරීන් 04 දෙනෙකු සම්මන්ත්‍රණයක් සඳහා විදේශ ගත වී තිබුණි.
(viii) XV වැනි පරිච්ඡේදයේ 3.1. ඡේදය	පරිවාස කාලයේ පසුවන නිලධාරිනියන් දෙදෙනෙකු අග්නිදිග ආසියා කළාපීය වැඩමුළුවක් සඳහා සහභාගී කරවා තිබුණි.
(ix) XXIV පරිච්ඡේදයේ 10.4 ඡේදය	සේවා කාලය අවුරුදු 10ට අඩු නිලධාරීන්ගේ ආපදා ණය ඇප සම්බන්ධයෙන් වන කොන්දේසි ඉටු කර නොතිබූ අතර ආපදා සහ කාර්ය මණ්ඩල ණය ඇප මඟින් සුරක්ෂිත කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ

(i)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන වක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.7 ඡේදය	අධිකාරිය පිහිට වූ 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වාම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර 2022 වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කර තිබුණ ද එය සම්පූර්ණ කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.
(ii)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන වක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශයෙහි 2.2.2(a)(v) ඡේදය	නිලධාරීන්ට අදාළ නොවන සාවද්‍ය අනුමැතීන් මෙන්ම අධිකාරියට අදාළ සියලු විධිවිධාන, රෙගුලාසි, වක්‍රලේඛ, ප්‍රසම්පාදන පටිපාටි යනාදිය සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කර ඇති බවට වූ සාවද්‍ය සහතික කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා තුළ ඇතුළත් කර තිබුණි.
(iii)	මාර්ගෝපදේශයෙහි 2.3 ඡේදය	සමාලෝචිත වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම පිළියෙල කර නොතිබුණි.
(iv)	මාර්ගෝපදේශයෙහි ඇමුණුම 01 හි 2(a) ඡේදය	ක්‍රියාකාරකම් පැහැදිලිව දැක්වෙන පරිදි ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවද, සමාලේචිත වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ඊට අනුකූලව පිළියෙළ කර නොතිබුණි.
(v)	මාර්ගෝපදේශයෙහි ඇමුණුම 01 හි 3(a) ඡේදය	සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම් ප්‍රකාශනය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර නොතිබුණු අතර වාර්ෂික අයවැය ලේඛනය ඵලදායී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.
(vi)	මාර්ගෝපදේශයෙහි 2.6 ඡේදය	පහත සංශෝධනය කර ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස ප්‍රධාන විධායක නිලධාරී කටයුතු කර තිබුණි.
(vii)	2022 දෙසැම්බර් 21 දිනැති අංක PED-08/2022 දරන වක්‍රලේඛය	ඉහිරි කර ගත් නිවාඩු සඳහා දීමනා ලබා ගැනීමට නිර්මිකම් නොවූවද, 2022 සහ සමාලෝචිත වර්ෂය සඳහා රු.8,129,017 ක් නිවාඩු දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ 9 ඡේදය	ඇප ලබාගත යුතු නිලධාරීන්ගෙන් අදාළ ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අයවැය චක්‍රලේඛ

(i) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන චක්‍රලේඛයේ 02 ඡේදය	අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව විශේෂ දීමනා හා පැමිණීමේ දීමනා ලෙස එකතුව රු.24,532,653 ක් ගෙවා තිබුණි.
(ii) 03(viii) හා 03(x) ඡේද	අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ආපදා හා කාර්ය මණ්ඩල ණය ලෙස පිළිවෙලින් රු.1,750,000 ක් හා රු.14,010,000 ක් ගෙවා තිබුණි.
(iii) 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන චක්‍රලේඛයේ 6(අ) ඡේදය	විදේශීය සම්මන්ත්‍රණ සඳහා දේශීය අරමුදල් භාවිතා කර නිලධාරීන් සහභාගී නොකළ යුතු වුවද, ඉන් බැහැරව නිලධාරීන් 4 දෙනෙකු සඳහා රු.1,983,315 ක් ගෙවා තිබුණි.

(ඊ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන චක්‍රලේඛ	අධිකාරිය ස්ථාපනය කර වසර 09 ක කාලයක් ගත වී තිබුණ ද, යෝග්‍ය පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් අනුමත කර ක්‍රියාත්මක කර නොතිබුණි.
(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවන් කර නොතිබුණි.
(iii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ 4 ඡේදය	මානව සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(උ) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ

(i) 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගන්නා ලද වටිනාකම රු.6,106,180 ක් වූ පරිගණක උපකරණ හා කාර්යාලීය උපකරණ අයිතම 13 ක් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ii) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන චක්‍රලේඛයේ 02 ඡේදය	සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වාහන 06 ක් මේ දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්		නිරීක්ෂණ
2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත		
(i)	14(ඒ) උප වගන්තිය	බලපත්‍ර යටතේ ආනයනය කරන ලද ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හෝ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදනවල ප්‍රමාණය පිළිබඳ අධිකාරිය විසින් දත්ත රැස් කර නොතිබුණු අතර එලෙස දත්ත රැස්කර ගත හැකිවන පරිදි ක්‍රමවේදයක් හෝ සකස් කර නොතිබුණි.
(ii)	14(ඔ) උප වගන්තිය	ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම්වලට අදාළ කර්මාන්ත සහ වෙළඳ ව්‍යදම් පිළිබඳ දත්ත ඇතුළුව, ශ්‍රී ලංකාවේ ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හෝ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදනවල භාවිතය පිළිබඳ අධිකාරිය විසින් දත්ත රැස් කර නොතිබුණු අතර එලෙස දත්ත රැස්කර ගත හැකිවන පරිදි ක්‍රමවේදයක් හෝ සකස් කර නොතිබුණි.
(iii)	30(1) හා 31(1) උප වගන්ති	ශ්‍රී ලංකාවේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කරුණු පිළිබඳව අමාත්‍යවරයා සහ අධිකාරිය වෙත උපදෙස් ලබා දීම ප්‍රධාන කර්තව්‍ය විය යුතු සාමාජිකයින් 24 දෙනෙකුගෙන් සමන්විත ජාතික උපදේශන කමිටුව මෙතෙක් ස්ථාපිත කර නොතිබුණි.
(iv)	45(1), 70(1) සහ 91(1) උප වගන්ති	අධිකාරිය විසින් පිළිවෙළින් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන සඳහා අදාළ ක්ෂේත්‍රවල විශේෂඥ දැනුමක් ඇති ප්‍රවීණ වෘත්තිකයන්ගෙන් සමන්විත විශේෂඥ මණ්ඩලයන් පත් කරනු ලැබිය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(v)	84(2) උප වගන්තිය හා 85 වගන්තිය	ලියාපදිංචි කරන ලද වෛද්‍ය උපකරණ හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවල එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව නියමයක් ගැසට් පත්‍රයේ පළ කර මහජනතාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු වුවද, අධිකාරිය ස්ථාපනය කළ දින සිට මේ දක්වා එම නියාමන අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.
(vi)	69(1)(ආ)(v) උප වගන්තිය	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු

		වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට පත් කර නොතිබුණි. වෛද්‍ය උපකරණද ඇතුළුව විකිරණශීලී උපකරණ හා ද්‍රව්‍ය ආනයනය හා භාවිතය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම හා නියාමනය පිළිබඳ බලතල හිමි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව නියෝජනය කිරීමේ අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි.
(vii)	72(1) හා 93(1) උප වගන්ති	වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් සඳහා අධිකාරිය විසින් එම ඇගයීම් කමිටු වෙත පොදු මාර්ගෝපදේශ නිකුත් කළයුතු වුවද එවැනි මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි. තවද, 72(4) හා 93(4) උප වගන්ති ප්‍රකාරව වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් පැවැත්වීම සඳහා වූ නිශ්චිත කාලසීමා ඇතුළු අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහන් කරමින්, යහපත් නිෂ්පාදන පරිවයන් පිළිබඳ මාර්ගෝපදේශ සහ වෙනත් අදාළ මාර්ගෝපදේශ බලාත්මක කිරීම සඳහා ද නියෝග පිළියෙල කර නොතිබුණි.
(viii)	74(1) හා 95(1) උප වගන්ති	අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ හා ලියාපදිංචි කරන ලද සීමාස්ථ නිෂ්පාදන අමාත්‍යවරයා විසින් කලින් කල ලැයිස්තුගත කර නොතිබුණි.
(ix)	83 (4)(ආ) හා 102(4)(ආ) උප වගන්ති	ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(x)	83(6) හා 102(6) උප වගන්ති	අමාත්‍යවරයා විසින්, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටු සහ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය යන ආයතන විසින් පරීක්ෂා කිරීමේ හෝ ඇගයීමේ ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි, එම ක්‍රියාවලියේ කාල සීමාවන්, රැස්වීම් පැවැත්විය යුතු ආකාරය, රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි සහ ඉදිරිපත් කළ යුතු වාර්තාවල ඇතුළත් කළ යුතු කරුණු නිශ්චිතව දක්වමින් නියෝග පිළියෙල කර නොතිබුණි.
(xi)	103(2) උප වගන්තිය හා 104 වගන්තිය	ලියාපදිංචි කරන ලද සීමාස්ථ නිෂ්පාදන පිළිබඳව හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවල එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව නියමයක් ගැසට් පත්‍රයේ පළ කර මහජනතාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු වුවද, අධිකාරිය ස්ථාපනය කළ දින සිට මේ දක්වා එම

නියාමන අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

(xii) 123 වගන්තිය

අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් අභියාචනා කමිටුවක් (Appeal Committee) පත් කළ යුතු අතර එම කමිටුව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයන් අතරින් පත් කරගනු ලබන සාමාජිකයකු, සෞඛ්‍ය ලේකම්වරයා සහ වෛද්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂතා පෙන්නුම්කර ඇති විශ්‍රාමලත් විශේෂඥ වෛද්‍යවරුන් අතරින් පත් කරනු ලබන සාමාජිකයෙකුගෙන් සමන්විත විය යුතුය. නමුත් මෙම අභියාචනා කමිටුව මෙතෙක් පත් කර නොතිබුණු අතර ඒ වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව අධිකාරියේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ඇතුළත් වන පරිදි අභියාචනා මණ්ඩලයක් (Appeal Panel) ස්ථාපිත කර තිබුණි. ඒ අනුව පිහිටුවා තිබුණු අභියාචනා මණ්ඩලය පනතට පටහැනි වී තිබුණු අතර එහි ස්වාධීනත්වය පිළිබඳව විගණනයේ දී ඇටළු සහගත විය.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඖෂධ තොරතුරු ප්‍රතිසංස්කරණ දත්ත පද්ධතිය සකස් කිරීමේ (Revamping the Medicine Database) කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණ ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ප්‍රකාරව වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව රු. 4,774,752 ක් ගෙවා තිබුණු ද, මෙම වාර්තාවේ දිනය වන විටත් පද්ධතිය නිෂ්කාර්යව පැවතුණි.

2.3 වෙනත් කරුණු

(අ) ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත බලාත්මක වීමත් සමඟ එතෙක් ශ්‍රී ලංකාව තුළ ඖෂධ, උපකරණ හා විලවුන් නියාමනය සම්බන්ධයෙන් බලාත්මකව පැවති 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත බලරහිත විය. නව විලවුන් පනත සම්මත කර ක්‍රියාත්මක කරනා තෙක් පැවති විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ විධිවිධාන භාවිතා කර විලවුන් නියාමනය සිදු කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට පැවරීමට අනුකූලව එවකට සිටි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අංක 17/2221/718/120 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එහෙත් 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත ඉවත් කර මේ වන විට වසර 09 ක කාලයක් ගත වී තිබුණ ද විලවුන් නියාමනය පිළිබඳ නව පනතක් සකස් කර සම්මත කර ගැනීමට හෝ අධිකාරී පනත අවශ්‍ය පරිදි සංශෝධනය කර

ගැනීමට අපොහොසත් වී තිබුණු අතර විලවුන් ලියාපදිංචිය සඳහා ඇගයීම, ලියාපදිංචි සහතික නිකුත් කිරීම, ආනයන බලපත්‍ර නිකුත් කිරීම වැනි සේවා වෙනුවෙන් පෙර පැවති විධිවිධාන යටතේ අය කරනු ලබන රු.500 න් රු.5,000 ක් අතර වන ගාස්තු ද වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කාරිනියක් පරිපාලන නිලධාරී වශයෙන් පත් කර තිබුණි. මෙම නිලධාරිනියගේ පත්වීමේ ලිපියේ 04 ඡේදය ප්‍රකාරව අධිකාරියේ සේවයේ නියැලී සිටින කාලය තුළ දී වෙනත් ආයතනයක දේශන සඳහා හෝ වෙනත් වෘත්තියක නියැලීමට අනුමැතියක් ලබා ගෙන නොතිබූ අතර ආරාධිත දේශකයෙකු වශයෙන් සේවය කර තිබුණද රජයට ගෙවිය යුතු රාජ්‍ය භාගයද ගෙවා නොතිබුණි.

(ඇ) විදේශ රටවල පැවැත්වෙන පුහුණු වැඩමුළු, වැඩසටහන්වලට නිලධාරීන් තෝරා ගැනීම හෝ නිර්දේශ කිරීම සම්බන්ධයෙන් අධිකාරිය තුළ අනුමත කරන ලද ලිඛිත නිර්ණායක, මාර්ගෝපදේශ හෝ ස්වාධීන තේරීම් කමිටුවක් ස්ථාපනය කර නොතිබුණු අතර ප්‍රධාන විධායක නිලධාරී විසින් අදාළ නිර්දේශ කිරීම් සිදු කර තිබුණි. කායිලන්තයේ පැවති "දේශීය නිෂ්පාදනය සඳහා තාක්ෂණ හුවමාරුව වේගවත් කිරීම සහ වෛද්‍ය නිෂ්පාදන සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම" සඳහා වූ අග්නිදිග ආසියා කළාපීය වැඩමුළුව සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමේ නිර්ණායකයන් වූ අදාළ විෂය ක්ෂේත්‍රය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ප්‍රතිපත්ති නිලධාරියෙකු යොමු කිරීම වෙනුවට තෘතීය මට්ටමට අයත් කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ පරිපාලන නිලධාරිනියක් මෙම වැඩමුළුව සඳහා යොමු කර තිබුණි.

(ඈ) නිශ්චිතව දක්වා ඇති විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන සාමාජිකයින් 13 දෙනෙකුගෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසව හා නාරීවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය, විශ්වවිද්‍යාලයක ඖෂධ වෛද්‍යවේදය පිළිබඳ මහාචාර්ය, ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය/කථිකාචාර්ය ධූරයන් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් අවස්ථා කිහිපයකදී මෙම සංයුතිය අසම්පූර්ණව පැවතුණි. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය අසම්පූර්ණව පැවතීම හේතුවෙන් ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් අභිතකරව බලපෑමේ අවධානම විඝණනයේ දී බැහැර කළ නොහැකි විය. එසේම ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීම වේගවත් කිරීමේ යාන්ත්‍රණය (Special Pathway) අනුමත කර ඇත්තේද ඖෂධ වෛද්‍යවේදය, ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය/කථිකාචාර්ය ධූරයන් පුරප්පාඩුව පැවති කාලසීමාව තුළදීය.

(ඉ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී අධිකාරියේ අනුමත තනතුරු සංඛ්‍යාව 257 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 158 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 98 ක් විය. එය අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 38 ක් වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතීය හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 33 ක්, 69 ක්, 22 ක් හා 19 ක් වශයෙන් තනතුරු 28 කට අදාළව පුරප්පාඩු 143 ක් පැවති අතර එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ අනුමත කරන ලද තනතුරු 269 කින් යුත් නව කාර්ය මණ්ඩලයෙන් සියයට 53 ක් විය.

(ඊ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති පුරප්පාඩු 33 අතරින් පිළිවෙලින් ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂ (නියාමන), (NMQAL), (නීති), (මානව සම්පත් හා පරිපාලන) හා (මූල්‍ය) යන

අධිකාරියේ පරිපාලන, මූල්‍ය සහ මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ වන ප්‍රධාන තනතුරු පුරප්පාඩුව පැවති අතර ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මඟින් අධිකාරිය වෙත පවරා ඇති කාර්යයන් ඉටු කිරීමේ දී සෘජුවම දායකවන ඖෂධ විශ්ලේෂක, සහකාර ඖෂධ විශ්ලේෂක, ඖෂධ ඇගයීම් නිලධාරී, සහකාර ඖෂධ ඇගයීම් නිලධාරී හා සහකාර ඖෂධ පරීක්ෂක යන තනතුරු 130 න් 82 ක් එනම් සියයට 63ක්ම පුරප්පාඩු වී තිබුණි.

(උ) ඖෂධවේදී තනතුර අධිකාරිය සඳහා අනුමත වූ කාර්යය මණ්ඩලයේ තනතුරක් නොවන අතර ඖෂධවේදීන් අධිකාරියේ සේවයේ යෙදවීම සඳහා ලබාගත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවිය. එසේ වුවද ඖෂධවේදීන් 07 දෙනෙකු සේවයේ යොදවා වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඌ) අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ සහකාර ඖෂධ පරීක්ෂක තනතුර සඳහා පැමිණිලි පිළිබඳ විශේෂ පරීක්ෂණ සිදු කිරීම, හදිසි වැටලීම් සිදු කර අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම වැනි කාර්යයන් පැවරී තිබුණ ද, ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 124(1) උප වගන්තිය යටතේ වූ බලයලත් නිලධාරීන් යන්නට මෙම තනතුර ඇතුළත්වේද යන්න විගණයේ දී ගැටළු සහගත වූ අතර මෙම තත්ත්වය කඩිනමින් නිරාකරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) අනුමත තනතුරු 33 න් ඉහළ කළමනාකරණ මට්ටමට අයත් තනතුරු 4 ක් සහ ද්විතියික මට්ටමට අයත් තනතුරක් සඳහා එනම්, අධ්‍යක්ෂ (නියාමන), (NMQAL), (මානව සම්පත් හා පරිපාලන), (මූල්‍ය) සහ තාක්ෂණ නිලධාරී (සිවිල්/ප්‍රවාහන) යන තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කර නොතිබුණි.

(ඒ) අධ්‍යක්ෂ (NMQAL), සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), නීති නිලධාරී, සහ පරිපාලන නිලධාරී යන තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමකින් තොරව දිගු කාලයක සිට රාජකාරී ආවරණය කිරීමේ හෝ වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණු අතර වෛද්‍ය නිලධාරී සහ අභ්‍යන්තර විගණක තනතුරු අනුමත කළ දින සිටම පුරප්පාඩුව පැවතුණි. මෙලෙස අනුමත තනතුරුවලින් අඛකට වඩා වැඩි ප්‍රමාණයක් පුරප්පාඩුව පැවතීම සහ අධිකාරියේ පරිපාලන, මූල්‍ය හා මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ වන ප්‍රධාන තනතුරු මෙන්ම පනත මඟින් අධිකාරිය වෙත පවරා ඇති කාර්යයන් ඉටු කිරීමේ දී සෘජුවම දායකවන තනතුරු පුරප්පාඩුව පැවතීම කාර්යක්ෂම සහ ඵලදායි ඖෂධ නියාමන ක්‍රියාවලියක් කෙරෙහි අහිතකර ලෙස බලපෑමක් ඇතිවීමේ අවධානම විගණනයේදී බැහැර කළ නොහැකි වේ.

(ඔ) අධිකාරියේ දන්ත පද්ධතිය ස්වයංක්‍රියකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණු අතර ඒ සඳහා රු.12,253,328 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා මෙම දන්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු ඇතැම් තොරතුරු මකා දමා තිබුණු අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු අවසන් වන තෙක් මෙම සේවාව අක්‍රිය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ විශේෂඥ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මඟින් පද්ධතියෙන් මකා දමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කළ නොහැකි බව දන්වා තිබුණු අතර මෙම වාර්තාවේ දිනය වන තෙක් සිදු වූ පාඩුව අය කර ගැනීමට හෝ අදාළ සමාගම වෙනුවෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් සඳහා කටයුතු කර නොතිබුණි.

(ඕ) මෙම වාර්තාවේ දක්වා ඇති කරුණුවලට අමතරව ඖෂධ හදිසි මිලදී ගැනීම සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම, ඖෂධ ලියාපදිංචියේ දී රජයේ ඖෂධ අවශ්‍යතාවයන් සැලකිල්ලට නොගැනීම, අධිකාරිය විසින් ඖෂධ ලියාපදිංචි කිරීම හා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම, ඖෂධවල මිල නියාමනය, ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීම සහ ඖෂධ ගබඩා හා ඖෂධ ප්‍රවාහනය නියාමනය කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ විගණනයේ දී නිරීක්ෂණය වූ කරුණු 2024 මැයි 10 දිනැති අංක SPR/2024/03 දරන පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විශේෂ විගණන වාර්තාවේ 7.5 සිට 7.11 දක්වා ඡේද තුළ ඇතුළත් කර ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පරිච්ඡේදය - 4

තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය (SDG)

ජාත්‍යන්තර සංවර්ධනය ලොව පුරා ජීවත් වන මිනිසුන්ගේ අවශ්‍යතා සහ ලැදිකම් තුළින් ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි. සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රජාතන්ත්‍රවාදය, තිරසර බව සහ ආර්ථිකය වැනි ක්ෂේත්‍ර සමඟ වැඩි අවස්ථා සහිතව වඩාත් සාධාරණ ජීවිත ගත කිරීමට මිනිසුන් වඩාත් හොඳින් සූදානම්ව සිටිති. එක්සත් ජාතීන්, සිය සංවර්ධන වැඩසටහන (UNDP) තුළින් "2030 වර්ෂය වන විට දුප්පත්කම අවසන් කිරීම, පෘථිවිය ආරක්ෂා කර ගැනීම සහ සියලුම මිනිසුන් සාමයෙන් සහ සමෘද්ධිමත්ව සතුටින් ජීවත්වීම" සහතික කිරීම පිණිස තිරසර සංවර්ධන අරමුණු (SDG) සමඟ වැඩ කරමින් කටයුතු කරයි. රටවල් සහ පාලන ප්‍රදේශ 170 කටත් අධික ගණනක දිළිඳු බව, ඒඩ්ස් (AIDS), කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව වෙනස්කම් කිරීම යන ප්‍රශ්න පිළිබඳව විසඳුම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී.

තිරසාර සංවර්ධන ඉලක්ක 17 න් 3 වෙනි ඉලක්කය වන්නේ මිනිසුන්ට සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමට ඔවුන්ගේ "යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම" සැලසීමට වගබලා ගැනීම ය. එමගින් ළමා මරණ නැති කොට මිනිසුන්ගේ අපේක්ෂා ඉහළ නැංවිය හැකි අතර එය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂය පථයට ඉතාමත් සමීප ලෙස අදාල වේ.

ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සියලුම ක්‍රියාකාරකම් සකස් කරනු ලබන්නේ පහත පරිදි මෙම තිරසර සංවර්ධන අරමුණෙහි (SDG) අංක 03 ලෙස ඇති ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා ය.

3.8 සියලුම දෙනාට මූල්‍ය අවදානම් ආරක්ෂාව, ගුණාත්මක බවින් යුත් අත්‍යාවශ්‍ය සෞඛ්‍යාරක්ෂක සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව සහ සුරක්ෂිත, ඵලදායී, තත්ත්වයෙන් ඉහළ සහ දැරිය හැකි මිලක් සහිත අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් ලබා ගැනීමට ප්‍රවේශවීමේ හැකියාව ඇතුළුව විශ්ව සෞඛ්‍ය ආවරණයක් සාක්ෂාත් කර ගැනීම.

3.අ දුම්කොළ පාලනය සම්බන්ධ ලෝක සෞඛ්‍ය සංවිධාන සම්මේලනයේ වැඩරාමුව සියලුම රටවල යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.

3.ආ සංවර්ධනය වෙමින් පවතින රටවලට මූලිකවම බලපාන බෝවන සහ බෝනොවන රෝග සඳහා එන්නත් සහ ඖෂධ සම්බන්ධයෙන් සිදුකරනු ලබන පර්යේෂණ සහ වැඩිදියුණු කිරීම්වලට සහාය වීම, මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ සුනම්‍යතා සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතීන්වල වෙළඳ සම්බන්ධ අංග සහිත ගිවිසුමේ (Agreement on Trade Related Aspects of Intelleatual Property Rights)

දැක්වෙන ප්‍රතිපාදන සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවට සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමේ අයිතිය සහතික කරනු ලබන TRIPS ගිවිසුම හා මහජන සෞඛ්‍යය සම්බන්ධ දෝහා ප්‍රකාශනයට අනුකූලව දැරිය හැකි මිලකට ලබාගත හැකි අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත්වලට ප්‍රවේශය ලබාදීම සහ සියලුම දෙනා සඳහා ඖෂධවලට ප්‍රවේශය ලබාදීම.

3.ඇ සෞඛ්‍ය කටයුතු සඳහා මූල්‍ය දායකත්වය සැලකිය යුතු ලෙස වැඩි කිරීම හා සංවර්ධනය වෙමින් පවතින රටවල විශේෂයෙන්ම අඩුවෙන් සංවර්ධනය වී ඇති රටවල සහ සංවර්ධනය වෙමින් පවතින තත්ත්වයේ සිටින කුඩා දූපත්වල සෞඛ්‍ය ශ්‍රම බලකාය බඳවා ගැනීම්, ඔවුන් සංවර්ධනය කිරීම, පුහුණු කිරීම, සහ රඳවා ගැනීම.

මෙම සියලුම ඉලක්ක ඖෂධ හා වෛද්‍ය උපකරණවල සුරක්ෂිත බව, ගුණාත්මක බව, සඵලත්වය හා මිල සම්බන්ධ කරුණු පෙරදැරි කරගෙන ඒවා නියාමනය කිරීම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථය තුලින් ඉටු කරනු ලබයි.

පරිච්ඡේදය - 5

අනුකූලතා වාර්තාව

අංකය	යෙදිය යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අදාළ නොවේ)	අදාළ නොවේ නම් - ඒ සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිශ්චිත ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත වේලාවට ඉදිරිපත් කර ඇත			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	අනෙක්	-		
2	**පොත් සහ ලේඛන නඩත්තු කිරීම** (මු.රෙ. 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගලික වැටුප් ලේඛන / පුද්ගලික වැටුප් කාඩ්පත් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තාව යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ සකස් කර නියමිත වේලාවට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ටරි යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		

2.8	ගබඩා ඉන්වෙන්ටරි යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		
2.9	අලාභ හා හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		
2.10	බැරකම් ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		
2.11	උප කඩදාසි පොත් ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම (GA-N20)	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යය නියෝජනය කිරීම**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පැවරීම පිළිබඳව ආයතනය දැනුවත් කර තිබිය යුතුය	අනුකූල වේ		
3.3	එක් එක් ගනුදෙනුව සඳහා නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අනුමත කළ හැකි පරිදි අධිකාරය පැවරීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති රජයේ ගිණුම් චක්‍රලේඛ අංක 171/204 අනුව රජයේ වැටුප් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයාගේ පාලනය යටතේ ක්‍රියා කිරීම	අදාළ නොවේ		
4	**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ		
4.3	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර නියමිත දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත වේලාවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අදාළ නොවේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් සඳහන් කර	අනුකූල වේ		

	ඇති සියලුම විගණන විමසුම් සඳහා ඔහු විසින් නියම කර ඇති නියමිත දිනට පිළිතුරු ලබා දීම			
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	DMA/1-2019-FR 134 (2) අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
6.2	මාසයක් ඇතුළත සෑම අභ්‍යන්තර විගණනයකටම ප්‍රතිචාර දැක්වීම	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ - 40 (4) උප වගන්ති ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
6.4	මූල්‍ය රෙගුලාසි 134(3) අනුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
7	**විගණන සහ කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ අංක 1- 201 අනුව අදාළ වර්ෂය තුළ අවම වශයෙන් විගණන සහ කළමනාකරණ කමිටු 04ක් පවත්වා තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 වන පරිච්ඡේදයට අනුව වත්කම් අත්පත් කර ගැනීම සහ බැහැර කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත 13 වන පරිච්ඡේදයේ එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කිරීම	අනුකූල වේ		

	සහ එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම.			
8.3	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පවත්වා නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිය යුතු වීම.	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
8.4	චක්‍රලේඛයේ සඳහන් කාල සීමාව තුළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ හෙළිදරව් වූ අතිරික්තයන්, අඩුපාඩු සහ අනෙකුත් නිර්දේශ ඉදිරිපත් කිරීම	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
8.5	මු. රෙ 772 ප්‍රකාරව භාවිත කළ නොහැකි අයිතම බැහැර කිරීම	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	මාස 06කට කාලයකට නොඅඩු සේවා කළ නොහැකි වාහන ධාවනය කළ නොහැකි වූ පසු බැහැර කර තිබිය යුතු වීම	අනුකූල වේ		
9.3	වාහනවල ලොග් සටහන් නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ 103,104,109 සහ 110 අනුව පියවර ගැනීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2016/30 හි 3.1 ඡේදයේ විධිවිධාන අනුව වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2016/30 හි 3.1 ඡේදයේ විධිවිධාන අනුව වාහනවල ඉන්ධන දහනය	අදාළ නොවේ		

	නැවත පරීක්ෂා කිරීම			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබිය යුතු වීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂය තුළ හෝ ඊට පෙර ඉදිරියට ගෙන එන ලද අක්‍රිය බැංකු ගිණුම් පියවා තිබිය යුතු වීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශනවල හෙළිදරව් කර සකස් කර ඇති ශේෂයන් සම්බන්ධයෙන් මූදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියා කර මාසයක කාලයක් තුළ එම ශේෂ පියවා තිබිය යුතු වීම	අනුකූල වේ		
11	**අරමුදල් උපයෝජනය**			
11.1	වෙන් කර තිබූ ප්‍රතිපාදන ඉක්මවා නොයන ලෙස වියදම් දැරීම	අනුකූල වේ		
11.2	94 (1) වගන්තියට අනුව සපයා ඇති ප්‍රතිපාදන භාවිතා කිරීමෙන් පසු සීමාව නොඉක්මවන ලෙස වර්ෂය අවසානයේ බැරකම් වෙත එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අදාළ නොවේ		
12.2	හිඟ ණය ශේෂයන් පිළිබඳ වයස් විශ්ලේෂණයක් කර තිබීම	අදාළ නොවේ		
12.3	වසරකට වැඩි කාලයක් සඳහා හිඟ ණය ශේෂය පියවා තිබිය යුතු වීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පතු ගිණුම**	අදාළ නොවේ		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 අනුව කටයුතු කර තිබිය යුතු වීම	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු ගිණුම් සඳහා පාලන ගිණුම යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අදාළ නොවේ		
14	**අග්‍රිම ගිණුම**	අදාළ නොවේ		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ මුදල් පොත් ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබිය යුතු වීම	අදාළ නොවේ		

14.2	මු.රෙ. 371 යටතේ නිකුත් කරන ලද අතුරු අග්‍රිම, නිශ්චිත වැඩ නිම කිරීමෙන් පසු මාසයක් ඇතුළත නිරාකරණය කර තිබීම.	අදාළ නොවේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව නොඉක්මවන පරිදි දැනට අතුරු අග්‍රිම නිකුත් කර ඇති බව	අදාළ නොවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අදාළ නොවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව එකතු කරන ලද ආදායමෙන් ආපසු ගෙවීම් කර තිබීම	අනුකූල වේ		
15.2	එකතු කරන ලද ආදායම තැන්පතු ගිණුමට තැන්පත් නොකර සෘජුවම ආදායම් ආදායමට බැර කිරීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 ප්‍රකාරව විගණකාධිපතිවරයාට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**	අනුකූල වේ		
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගැනීම	අනුකූල වේ		
16.2	සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබිය යුතු වීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
17	**මහජනතාවට තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සහ රෙගුලාසිවලට අනුකූලව තොරතුරු නිලධාරියෙකු පත් කිරීම සහ සපයන ලද තොරතුරුවලින් සමන්විත ලේඛනයක් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දීම සහ මහජනතාවට තම අදහස්/චෝදනා එම වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග ඔස්සේ ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම.	අනුකූල වේ		

17.3	තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 8 සහ 10 වගන්තිවලට අනුව වසරකට දෙවරක් හෝ වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2018 සහ 2018.05 (1) චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව පුරවැසි /සේවාදායක ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	ඉහත කී චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව, පුරවැසි /සේවාදායකයාගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාරණය අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර තිබිය යුතු වීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සකස් කිරීම**			
19.1	2018. 01. 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02 / 2018 ඇමුණුම 02 මත පදනම්ව මානව සම්පත් සැලැස්ම සකස් කිරීම	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
19.2	ඉහත මානව සම්පත් සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වසරකට අවම වශයෙන් පැය 12 ක පුහුණුවක් සහතික කර තිබිය යුතු වීම.	අනුකූල වේ		
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දක්වා ඇති ආකෘතිය මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුමක් අත්සන් කර තිබිය යුතු වීම.	අදාළයි - සිදුකර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයට අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, කුසලතා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක	අනුකූල වේ		

	කිරීම සඳහා වගකීම ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබීම.			
20	**විගණන විමසුම් වලට පිළිතුරු දීම**			
20.1	පසුගිය වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ විගණන ඡේදවල සඳහන් අඩුපාඩු නිවැරදි කිරීම	අනුකූල වේ		